# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 90 — 1973 දෙසැම්බර් 14 වැනි සිකුරාදා — 1973.12.14

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 1313 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | 1318 |
| කනතුරු—ඇබෑර්තු ... ... ... | 1314 | අය-වැය ලේඛන ... ... ... | 1319 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1317 | දේපල විකිණීම ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | 1317 | මාර්ග කොමිටි දන්වීම ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — | විවිධ දැන්වීම ... ... ... | 1328 |


සැලකිය යුතුයි.—ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 45 දරන ලොරි බලපත්‍ර ලබා ගැනීමේ සහ අත් කර ගැනීමේ පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 46 දරන ධීවර (සංශෝධන) පනත 1973 දෙසැම්බර් මස 14 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයන් වශයෙන් පලවේ.

## පළාත් පාලන නිවේදන

ප.පා.දෙ.එච්ඩී 1/3/5.

### ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 47 වැනි වගන්තිය (2) වැනි උප වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති විසින් පනවන ලද ආඥාව.

පීf. ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු ඇමති.

1973 දෙසැම්බර් මස 1 දින,
කොළඹ දීය.

### ආඥාව

ගම්සභා ආඥාපනතේ 47 වැනි වගන්තියේ (1) උප වගන්තිය, රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරලේ පල්ලේපත්තු ගම් ප්‍රදේශයේ ගම්සභාව සම්බන්ධයෙන් අදාල නොවිය යුතුයයි ප්‍රකාශයට පත් කරමින් 1971 නොවැම්බර් මස 5 වැනි දින අංක 14,983 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද ආඥාව මෙයින් අවලංගු කරනු ලැබේ.

12–435—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාදවී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.**

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

**1973 ජනවාරි මස 7 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**කොළඹ.**

**ගම්සභා ආඥාපනත**

ගම්සභා ආඥාපනතේ අංක 17 (5) දරණ වගන්තිය යටතේවූ දැන්වීමයි

1961 අංක 60 පණතින් සංශෝධිත, ගම්සභා ආඥා පනතේ (257 වැනි අධිකාරය) 17 (5) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මහනුවර දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස්, මුතුබණ්ඩාර සමරකෝන් වන මා විසින් මෙහි පහත උප ලේඛනයේ I වැනි තීරුවෙහි නියමිත ගම් සභාවේ රැස්වීම එකී උප ලේඛනයේ II වැනි තීරුවෙහි අනුරූප සටහනින් නියමිත දිනයේදී ද, එකී උප ලේඛනයේ III වැනි තීරුවෙහි අනුරූප සටහනින් නියමිත වේලාවටද, එකී උප ලේඛනයේ IV වැනි තීරුවෙහි අනුරූප සටහනින් නියමිත ස්ථානයේදී ද, මෙයින් කැඳවා සිටිනු ලැබේ.

මුතු බණ්ඩාර සමරකෝන්,
පළාත් පාලන සහකාර කොමසාරිස්, මහනුවර.

1973 නොවැම්බර් මස 28 වැනි දින,
මහනුවර, පළාත් පාලන කාර්යාලයේදීය.

උප ලේඛනය

| I වන තීරුව | II වන තීරුව | III වන තීරුව | IV වන තීරුව |
|---|---|---|---|
| **ගම්සභාවේ නම** | **දිනය** | **වේලාව** | **ස්ථානය** |
| යටිනුවර කඳුපලාත ගම්සභාව ... | 1973.12.22 ... | පෙරවරු 10.00 ... | යටිනුවර කඳුපලාත ගම්සභා කාර්යාලය, අමුණුපුර, මැණික්දිවෙල. |

12–354—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

# තනතුරු — ඇබෑර්තු

## ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදල වන පොදු කොන්දේසි

1. **දීමනා.**—රජයේ නිලධාරීන්ට අදළ වන ප්‍රමාණයන් හා කොන්දේසි අනුව විවාහක දීමනාවක් ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී 1969 අංක 18 දරණ පළාත් පාලන සේවා පනතට හා පළාත් පාලන සේවා රෙගුලාසිවලටත් කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසි වලටත් යටත් වෙයි.

3. **සේවය භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(අ) පළාත් පාලන සේවයේ මාසික වැටුප් ගෙවනු ලබන තනතුරුවලට පත්කරනු ලබන සියලු දෙනාම පළාත් පාලන සේවා අර්ථසාධක අරමුදලට දායක වනු ඇත. මෙම අරමුදලට සේවකයා විසින් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් සියයට 6ක් දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය. අදළ නිලධාරිතැනගේ ඒකාබද්ධ වැටුපෙන් සියයට 9ක් ඔහු සේවය කරනු ලබන ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් ඔහු වෙනුවෙන් ගෙවනු ලැබේ.

(ආ) ආණ්ඩුව යටතේ සේවය කරන නිළධාරීන්, ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 21 වන වගන්තිය යටතේ සේවයෙන් මුදා හරිනු ලැබ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මාරුකරනු ලැබුවහොත්, ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්ෂා වේ. **පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන නිළධාරියෙකු එම සේවයේ විශ්‍රාම වැටුප් සහිත වෙනත් තනතුරකට පත්කරන ලද්දේ නම් හෝ උසස් කරන ලද්දේ නම් ඔහු සිය නව තනතුරෙහිද විශ්‍රාම වැටුප් හිමිකම් තවදුරටත් භුක්ති විඳිනු ඇත.**

(ඇ) ප්‍රාදේශීය බලමණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථාවේ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරණ සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේදී සේවයෙන් විශ්‍රාම ගැනීමේදී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ, 1969 අංක 18 දරණ පළාත් පාලන සේවා පනත ප්‍රකාර, පළාත් පාලන සේවයට මාරුකරනු ලැබූ දිනයට කලින්ද ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශීය බලමණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුවය.

(ඈ) පළාත් පාලන සේවයේ මාසික වැටුප් ගෙවනු ලබන තනතුරු වලට පත්කරනු ලබන නිළධාරීන්ට වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය අදළ නොවනු ඇත. එහෙත්, ස්ත්‍රීන්ද, වයස අවුරුදු 55ට වැඩි නිළධාරීන්ද, පළාත් පාලන සේවයට පත්කරන ලද දිනයට පෙර, ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරූ නිළධාරීන්ද හැර, පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක සිට වෙනත් විශ්‍රාම වැටුප් සහිත තනතුරකට උසස් කරන හෝ පත්කරන ලද සියලු දෙනාටම 1952 ජූනි 30 වන දින හා 10,329 වැනි අංකය දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළකරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට ස්වකීය අනුමාන මූලික වැටුපෙන් සියයට 4ක මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් ඒ ඒ නිලධාරියාගේ අනුමාන මූලික වැටුපෙන් සියයට 3 ක දායක මුදලක් ගෙවනු ලැබේ.

(ඉ) ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක්, මුලින්ම හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඇපකාර සමාගමක් මගින්/ ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මගින් හෝ ඇප තබන ලෙස මේ තනතුරුවලට පත්වන්නන්ට නියම කල හැකිය.

(ඊ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම පළාත් පාලන සේවයට අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට දිවයිනේ කවර පෙදෙසක වුවද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන් සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

(උ) අන්‍යාකාරයකින් නියමකොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම අවුරුදු තුනක ආධුනික කාලයකට හෝ අවුරුදු තුනකින් පසු ස්ථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(ඌ) අයදුම්කරුවන් නියම කරනු ලැබූ අවස්ථාවක ඔවුන්ගේ උප්පැන්න සහතික හෝ අනුමාන වයස පිළිබඳ සහතික ඉදිරිපත් කිරීමට සූදානම් වී සිටිය යුතුයි.

(එ) පත්කරනු ලබන අය දිවයිනෙහි ඕනෑම පෙදෙසක සේවය කළ යුතුය.

4. **පළාත් පාලන සේවයට නව ප්‍රවේශක නිලධාරීහු.**—(i) අදල පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත්කරනු ලැබූ නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය යම්කිසි තනතුරු වෙනුවෙන් වඩා දීර්ඝ කාලයක් නියමකොට නැත්නම් අවුරුදු 3ක් වන්නේය.

(ii) 1956 අංක 33 දරණ රාජ්‍යභාෂා පනතේ විධිවිධානවලටත්, ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා දැනට පවත්නා වූත් හෝ මින්මතු සම්පාදනය කළ හැකි වූ කිසියම් නියෝග හෝ නීතිරීතිවලටත් එකඟවීමේ කොන්දේසියට සියලුම නව ප්‍රවේශක නිලධාරීන් එකඟ විය යුතුය.

(iii) රාජකාරි කටයුතු කාර්යක්ෂම ලෙස ඉටුකිරීමෙහි ලා අත්‍යවශ්‍ය නොවන්නාවූ විශේෂ අවස්ථාවන්හිදී හැර, ඔවුන් ස්වකීය ආධුනික/වැඩ පරීක්ෂණ කාලපරිච්ඡේදය ඇතුළත රාජ්‍ය භාෂාව වන සිංහලෙන් වැඩ කිරීමේ දැනුමක් ලබාගත යුතුය.

(iv) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂණ කාලය අවසානයේදී පත්වීම ස්ථිර කිරීම, අනිකුත් කරුණු අතර, නියමිත කාලසීමාව තුළදී කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර තත්ත්වයට වඩා ඉහළ නොවන මට්ටමක් දක්වා වූ සිංහල පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත්වීම උඩ රඳා පවතී. නියමිත කාලසීමා ඇතුළත දී මෙම පරීක්ෂණවලින් අසමත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් එසේ නියමිත පරීක්ෂණවලින් සමත්වනතුරු නියමිත වැටුප් වැඩිවීම් නොගෙවනු ලබන අතර, ස්වකීය ආධුනික කාලය/වැඩ පරීක්ෂණ කාලය අවසාන වනවිට, සිංහල ප්‍රවීණතාවය පිළිබඳ නියමිත තත්ත්වය ලබා ගැනීමට අසමත් වන නිලධාරීන්ගේ සේවය අවසන් කරනු ලැබිය හැකිය.

(v) **අධ්‍යාපනික සහ අනිකුත් සුදුසුකම්.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ ඊට උසස් විභාගයකින් හෝ සාමාර්ථ්‍යය අඩුම සුදුසුකම් වශයෙන් නියමකොට ඇත්තා වූ සෑම බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියකදීම සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙකු වන අයදුම්කරුට ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් ලබන ලද සිංහල භාෂාව පිළිබඳ හෝ ඊට සමාන විෂයයකින් සම්මානයක් තිබිය යුතුය.

(1963 පෙබරවාරි මස 8 වැනි දිනට පූර්ව වූ දිනයක සිට පළාත් පාලන සේවයේ සිටියා වූත්, පළාත් පාලන සේවයේ වෙනත් තනතුරු ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් කෙරෙහි මේ අවශ්‍යතාව අදල නොවේ.)

සටහන.—(i) පළාත් පාලන සේවයට ඇතුලුවීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබාගන්නා අය තනතුරු ස්ථිර කිරීම සඳහා පූර්ව අවශ්‍යතාවයක් වශයෙන් වූ සිංහල ප්‍රවීණතා පරීක්ෂණ සමත්වීමෙන් නිදහස් කරනු ලැබේ.

(ii) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා "නව ප්‍රවේශක" යන පදය අදල වනුයේ 1960.1.29 දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරන ලද ගැසට් නිවේදන අනුව පළාත් පාලන සේවයේ තනතුරුවලට පළමුවරට පත්කරනු ලබන නිලධාරීන්ටය.

(iii) රජයේ සේවයෙහි නියැලිව සිට, පළාත් පාලන සේවයේ තනතුරු භාරගැනීම සඳහා සේවයෙන් නිදහස් කරනු ලබන්නාවූ "ආදි ප්‍රවේශක නිලධාරීන්" කෙරෙහි ඉහත 4 වැනි ඡේදයේ (iii) හා (iv) දරණ ඡේදවල සඳහන් විධිවිධාන අදල නොවේ.

5. සෑම අයදුම්කරුවෙකු විසින්ම තමා ලාංකිකයකු බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි. "ලාංකිකයා" යනු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.

6. **සේවාමුක්ත භටයින් සඳහා අනුග්‍රහ.**—(අ) සේවාමුක්ත වූ අයදුම් කරුවනට ඔවුන්ගේ නිත්‍ය භට හමුද සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම්කර ඇති තනතුරුවල නියමිත උපරිම වයස් සීමාව ඇතුළතට පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය භට සේවා කාලපරිච්ඡේදය එසේ අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය නියමිත අඩුම අධ්‍යාපන සුදුසුකම්, ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවා මුක්තයන් වන අයදුම්කරුවනට අවසර දෙනු ලැබේ.

7. **වයස පිළිබඳ අනුග්‍රහය.**—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධ යෙන් පළකෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකා අයදුම්පත් එවීමට ස්ථිර තනතුරක් දරණ, වර්ෂ දෙකක අඛණ්ඩ සේවාවක් ඇති ප්‍රාදේශීය බලමණ්ඩලයන්හි සේවකයන්ට පුළුවන.

8. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩල සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානියන්ගේ මාර්ග යෙනි. ආණ්ඩුවේ සේවයේ ස්ථිර තනතුරු දරණ නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම් කරුවන් තෝරාගනු ලැබුවහොත්, ඔවුන් ස්වකීය තනතුරුවලින් මුදවන්නට තමන් සූදනම්ව සිටිද්ද නැද්දයි සඳහන් කළ යුතුය.

**(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයනට නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක්, අන්කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.**

**(iv) කිසිම අපේක්ෂකයෙකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම්, ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයෙකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර** අන්දමේ වුවද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බලපැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම ඒ අපේක්ෂකයා සුනුදුසු බවට පත් වන්නේය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන්කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දනගන්නට ලැබුණි නම්, ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුනි නම්, රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සළකා බලනු නොලැබේ. අයදුම්පතක් තැපැලේදී ප්‍රමාද වූ බවට හෝ නැතිවූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වන තුරු ස්වකීය අයදුම්පත් **ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූම ඒ අවදනමට මුහුණ පාති.**

**අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු**

**අයදුම් පත් ආකෘතිය**

පළාත් පාලන සේවය

**සැ.යු.**—(i) අයදුම් පත්‍ර පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට තනතුරු අදළ වන ගැසට් නිවේදනයෙහි සඳහන්, අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු, කොළඹ 1, තැ.පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම් පත්‍ර ලේකම්ගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැළකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවන් වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවන් ස්වකීය අයදුම් පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි, සිංහල, දෙමළ යන භාෂාවලින් සමත්වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය. (2) චරිත සහතිකය. (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදළවන වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරන්න.

**————————— තනතුර සඳහා වූ අයදුම් පත**

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය :————.

   (ආ) අල්ලුම්කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.

   ජාතිය :————.

   (එම ලියාපදිංචිවීමෙන් ලාංකිකයෙකු වී නම්, පුරවැසිභාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැඳැහුම් අංකයත් සඳහන් කරන්න.)

3. තැපැල් ලිපිනය :————.

   (ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයට නියම වයස :—

   අවුරුදු :————, මාස :————, දින :————,

   (ආ) උපන් දිනය :—

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

   (අ) අයදුම්කරු :————.

   (ආ) අයදුම්කරුගේ පියා :————.

   (ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

   (ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.

   (අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ), (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුය. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) පිරවිය යුතුය.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තිය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපනික සුදුසුකම් :—

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍රය/අ.පො.ස. (සාමාන්‍ය පෙළ)

| | සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ය සාමාර්ථය |
|---|---|---|---|---|
| පළවෙනි වාරය | | | | |
| දෙවැනි වාරය | | | | |

(ආ) අ.පො.ස. (උසස් පෙළ)—

| සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ය සාමාර්ථය |
|---|---|---|---|
| | | | |

(ඇ) වෙනත් උසස් අධ්‍යාපනික සුදුසුකම්—

| විභාගයේ නම | සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් |
|---|---|---|---|
| | | | |

(ඈ) සමර්ථ වී ඇති උසස්ම විභාගය :—

(i) සිංහල :————.

(ii) දෙමල :————.

(iii) ඉංග්‍රීසි :————.

9. ලබාගෙන ඇති වෘත්තිය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතනවල නම් :————,

10. වෘත්තිය/කාර්මික/කර්මාන්ත පළපුරුද්ද :—

| ආයතනයේ නම | ආධුනිකත්වයේ ස්වභාවය/දරූ තනතුර | සිට | දක්වා |
|---|---|---|---|
| | | | |

(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි)

11. (අ) පාඨශාලාවෙන් අස් වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයන් හා අස් වූ දිනයන් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න) :————.

(ආ) මිට පළමු, ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් හෝ රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු) පළාත් පාලනායතන හා කාල සීමාවන් :————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද ? :————.

(ඉ) සේවා මුක්ත භටයෙක් නම්—සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දිනය හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කථා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :—

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්.—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම්, ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද, එසේ නම් දිනය, නඩු අංකය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15, මුදල් කරදර වලින් නිදහස්ද එසේ නැත්නම්, ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක්ද? : ————.

16. වෙනත් විස්තර (විශෙෂ හිමිකම් ආදිය) : ————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.

(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව, පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

මේ අයදුම් පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත්, මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————,

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්,
කැ.පෙ. 530, කොළඹ 1.

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදපත්තු මැද ගම්සභාව

පුස්තකාල භාරකරු තනතුර

ඉහත නම් සඳහන් ගම්සභාවේ පුස්තකාල භාරකරු තනතුර සඳහා ස්ත්‍රී/ පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

2. **වාර්ෂික වැටුප් ක්‍රමය.**—රු. 504—8 × 30—රු. 744 යන වැටුප් ක්‍රමයට අනුව වැටුප් ගෙවනු ලැබේ.

3. තනතුර ස්ථිරය. අර්ථසාධක අරමුදලට හිමිකම් ඇත. මෙම පත්වීම අවුරුදු දෙකක ආධුනික කාලයකින් පසු ස්ථිර වේ.

4. **අවශ්‍ය සුදුසුකම් :—**

(1) ඉල්ලුම්කරු ලාංකිකයෙකු විය යුතු අතර් පොළොන්නරුව මැද පත්තු මැද ගම්සභා සීමාව තුල 1973.12.20 වෙනි දිනට අවුරුදු පහකට නො අඩු කාලයක් ස්ථිර පදිංචියක් ඇති අයෙකු විය යුතුය.

(2) 1973.12.20 වෙනි දිනට වයස අවුරුදු දහඅටට නො අඩු හා විසිපහට නොවැඩි විය යුතුය.

(3) අපේක්ෂක අපේක්ෂිකාවන් වාර දෙකකට නොවැඩි වාර ගණනකදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් අංක ගණිතය ඇතුළු සම්මාන 4 ක් සහිතව සමත්වී සිටිය යුතුය.

(4) කාර්යාල ලිපි කටයුතු, පුස්තකාල කටයුතු පිළිබඳ පුහුණුවක් ලබා සිටීමත්, සිංහල සහ ඉංග්‍රීසි යතුරු ලියනය ක්‍රියාකිරීම ගැන සාමාන්‍ය හැකියාවක් තිබීමත් විශේෂ සුදුසුකමක් හැටියට සළකනු ලැබේ.

(5) අයදුම්කරුවන් තම අයදුම්පත් වලට පහත සඳහන් ලිපිවල පිටපත් අමුණා එවිය යුතුයි. මුල් පිටපත් නොවේ.

1. උප්පැන්න සහතිකය.
2. ලබා ඇති උසස්ම අධ්‍යාපන සහ වෙනත් සුදුසුකම් පිළිබඳ සහතිකය.
3. චරිතය පිළිබඳ ලබාගත් සහතික පිටපත් තුනක්. මෙයින් එකක් ග්‍රා. සේ. මහතා ගේ සහතිකය විය යුතු අතර එම සහතිකය ප්‍රා.ආ.නි. විසින් අනු අත්සන් කර තිබිය යුතුය.

6. **අයදුම්පත්.**—රජයේ ගැසට් පත්‍රයේ **IV** වැනි කොටසේ ආරම්භයේ පළකර තිබෙන පළාත් පාලන තනතුරුවලට පත්කිරීම සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ අයදුම්පතට අනුකූලව සකස් කොට අයදුම් පත් 1973.12.20 වෙනි දිනට හෝ ඊට කලින් පොළොන් නරුව දිස්ත්‍රික්කයේ මැද පත්තු මැද ගම්සභාවේ සභාපතිතුමාට ලැබෙන සේ ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

ලීලාරත්න විජේසිංහ,
පොළොන්නරුව මැද පත්තු මැද ගම්සභාපති.

1973 ක්වූ නොවැම්බර් මස 20 වෙනි දින,
පොළොන්නරුව—පලුගස්දමන,
මැදපත්තු මැද ගම්සභාවේ දීය.

12–477– 73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

පළාත් පාලන සේවය

ස්ථාන මාරුව සහිත පහළ ශ්‍රේණියේ ලඝුලේඛකයින්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය—1973 මැයි මස 09 වැනි දින

ඉහත සඳහන් විභාගයේ ප්‍රතිඵල පහත දක්වේ :—

**I වැනි ශ්‍රේණියේ කා.ක. විභාගය (සිංහල)**

ඩී. එස්. පෙරේරා ... සමත් වී ඇත

**II වැනි ශ්‍රේණියේ කා.ක. විභාගය (ඉංග්‍රීසි)**

සමත්වී ඇති විෂයය

එෆ්. පී. ජ්. සිල්වා ... ලඝුලේඛනය හා ටයිප් ගැසීම

**II වැනි කා.ක. විභාගය—සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණය (සිංහල)**

*එම්. ඩී. මුනිදාස ... සමත්වී ඇත

**II වැනි කා.ක. විභාගය—සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණය (සිංහල)**

*ඇම්. ජී. නන්දපාල ... සමත්වී ඇත

**II වැනි කා.ක. විභාගය—සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණය (ඉංග්‍රීසි)**

*ජ්. බී. පර්නාන්ඩිස් ... සමත්වී ඇත

* විභාගය සම්පූර්ණ කරයි.

එඩ්ගා ප්‍රනාන්දු,
ලේකම්,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව.

1973 නොවැම්බර් මස 22 වැනි දින.
තැ. පෙ. 530,
කොළඹ.

12–352—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

# අතුරු ව්‍යවස්ථා

ඇල්. ඩී.—බී 23/64

දන්කොටුව සුළු නගර සභාව

සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 (1) වන සහ 156 වන වගන්ති යටතේ දන්කොටුව සුළු නගර සභාව විසින් සාදනු ලැබ, ඒ ආඥාපනතේ 153 වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් අනුමත කරණ ලද අතුරු ව්‍යවස්ථා.

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973 දෙසැම්බර් මස 3 වැනි දින,
කොළඹ දී ය.

අතුරු ව්‍යවස්ථා

ප්‍රසිද්ධ වෙළෙඳ පොළ

1. සභාව විසින් පිළිගනු ලැබූ සම්මත පොදු අතුරු ව්‍යවස්ථාවල XV වන කොටසේ 1 වන අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා වෙළඳ ප්‍රදේශය සභාවේ පරිපාලන සීමාව තුළ වූ ප්‍රදේශය විය යුතුය.

2. සභාපති විසින් ඒ වෙනුවෙන් නිකුත් කරන ලද බලපත්‍රයක බලය ප්‍රකාර මිස, කිසිම තැනැත්තකු විසින් ප්‍රසිද්ධ වෙළඳ පොළේ හැර, වෙළඳ ප්‍රදේශය තුළ ඌරු මස්, පලතුරු හෝ එළවළු විකිණීම හෝ විකිණීම පිණිස ඉදිරිපත් කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම නොකළ යුතුය.

3. සභාව විසින් පිළිගනු ලැබූ සම්මත පොදු අතුරු ව්‍යවස්ථාවල XV වන කොටසේ 4 වන අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා වෙළඳ පොළෙහි යම් වෙළෙඳ පිළක්, ආයතනයක් හෝ ඉඩ ප්‍රමාණයක් පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම සඳහා පහත දක්වෙන ප්‍රමාණයන් අනුව ගාස්තු වක් පැනවිය යුතු අතර එම ගාස්තුව ගෙවිය යුතු ය :—

| | දිනකට ගාස්තුව රු. ශ. |
|---|---|
| (1) එක් එක් තාවකාලික හෝ ස්ථිර වෙළඳ පිළක් කාමරයක් හෝ මඩුවක් සඳහා— | |
| වර්ග අඩි 60කට හෝ ඊට වැඩි නොවන විට ... | 2 50 |
| වර්ග අඩි 60 කට වැඩිවන විට ... ... | 4 0 |
| (2) එළිමහන් බිමෙහි එක් එක් බිම් ඒකකය සඳහා— | |
| (අ) වර්ග අඩි 09 කට වැඩි නොවන විට ... | 25 |
| (ආ) වර්ග අඩි 09කට වැඩි නමුත් වර්ග අඩි 18කට වැඩි නොවන විට ... ... ... | 75 |
| (ඇ) වර්ග අඩි 18කට වැඩි නමුත් වර්ග අඩි 24කට වැඩි නොවන විට ... ... ... | 1 50 |
| (ඈ) වර්ග අඩි 24කට වැඩි නමුත් වර්ග අඩි 30කට වැඩි නොවන විට ... ... ... | 2 0 |
| (ඉ) වර්ග අඩි 30කට වැඩිවන එක් එක් අතිරේක වර්ග අඩියක් හෝ ඉන් කොටසක් සඳහා ... | 50 |

4. මේ අතුරු ව්‍යවස්ථාවල—

''සභාපති '' යන්නෙන් සභාවේ සභාපති අදහස් වේ.

''සභාව'' යන්නෙන් දන්කොටුව සුළු නගර සභාව අදහස් වන අතර,

''පොදු වෙළඳ පොළ'' යන්නෙන් සභාව විසින් පිහිටුවා ඇති වෙළඳ පොළ අදහස් වේ.

12—436—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

# ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන

වත්තල–මාබෝලෙ නගර සභාව

1971–12–31 දිනට ශේෂ පත්‍රය

| බැරකම් : | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ක්ෂය සංචිතය ... ... | | 39,695 08 |
| තැන්පත් ... ... | | 1,52,664 12 |
| රජයේ ආධාර— | | |
| 1. ඇවරිවත්ත නිවාස යෝජනා ක්‍රමය ... | | 17,594 18 |
| 2. මතුපිට කාණු ක්‍රමය ... | | 88,900 0 |
| 71.12.31 දිනට ආදායම ... | 7,93,887 36 | |
| 71.12.31 දිනට වියදම ... | 8,85,743 51 | |
| 71.12.31 දිනට ඌනතාවය ... | 91,856 15 | |
| 70.12.31 අතිරික්තය ... | 3,40,079 07 | |
| 71.12.31 දිනට අතිරික්තය ... | | 2,48,222 92 |
| | | 5,47,076 30 |

| වත්කම් : | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| අත්තිකාරම් ... ... | | 1,13,367 58 |
| තැපැල් ගිණුම ... ... | | 30 0 |
| ඉතිරිකිරීමේ බැංකු ගිණුම ... | | 194 55 |
| තැපැල් ඉතිරි කිරීමේ බැංකු ගිණුම ... | | 850 0 |
| ස්ථිර තැන්පත්— | | |
| ඇවරිවත්ත නිවාස යෝජනා ක්‍රමය ... | 20,981 34 | |
| මතුපිට කාණු ක්‍රමය ... ... | 1,06,463 52 | |
| විදුලි යෝජනා ක්‍රමය ... | 42,362 32 | |
| | | 1,69,807 18 |
| මහජන බැංකුවෙ ස්ථිර තැන්පත් ... | | 1,54,000 0 |
| ලංකා බැංකුවෙ ස්ථිර තැන්පත් ... | | 48,750 0 |
| 71.12.31 දිනට මුදල් පොතේ ශේෂය ... | | 60,076 99 |
| | | 5,47,076 30 |

වත්තල–මාබෝලේ නගරසභාවෙ සභාපති, පි. ආර්. පර්සි ඩයස් වන මම, මගේ දැනීම හා විශ්වාසය පරිදි ඉහතින් දක්වා ඇති වත්තල–මාබෝලෙ නගර සභාවේ 1971.12.31 දිනට ශේෂය පිළිබඳ ප්‍රකාශනය සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි.

හැරල්ඩ් ප්‍රනාන්දු,
අංක 5 කොට්ඨාශයේ නියෝජිත.

පි. ආර්. පර්සි ඩයස්,
සභාපති, වත්තල–මාබෝලෙ නගර සභාව.

1972 ජූලි මස 28 වෙනි දින මා ඉදිරිපිටදී සහතික කරන ලදි.

1972 ජූලි මස 28 වෙනි දින,
වත්තල–මාබෝලේ නගර සභා කාර්යාලය.

ආර්. ඒ. ගුණවර්ධන,
සමාදාන විනිශ්චයකාර තැන.

වත්තල–මාබෝලෙ නගර සභාව

1971 වර්ෂයේ ආදායම් හා වියදම් දක්වෙන ප්‍රකාශනය

| අය ශීර්ෂය | ආදායම රු. ශ. |
|---|---|
| ඒ.—සාමාන්‍ය ආදායම ... ... | 3,28,290 17 |
| බී.—පොදු මංමාවත් ... ... ... | 1,709 64 |
| සී.—තානායම් හා අම්බලම් ... ... | — |
| ඩී.—නගරසභා ඉඩම් සහ ගොඩනැගිලි ... ... | 15,733 74 |
| ඊ.—මහජන සුවය ... ... | 55,381 40 |
| ඇෆ්.—පොදු විනෝද කටයුතු ... ... | 38,139 35 |
| ජී.—සොහොන් බිම් ... ... ... | 237 50 |
| එච්.—බල්ලන් ලියාපදිංචි කිරීම ... ... | — |
| අයි.—තරාදි පඩි සහ සේරු ... ... | 702 90 |
| ජේ.—විදුලිය දෙපාර්තමේන්තුව ... ... | 3,52,922 76 |
| කේ.—ගිනි නිවීමේ කටයුතු ... ... | — |
| එල්.—පලතුරු ගස් සැපයීම ... ... | — |
| එම්.—කියවීම්ශාලා ... ... | 769 90 |
| | 7,93,887 36 |
| වෙනත් ආදායම්— | |
| තැන්පත් මුදල් ... ... ... | 1,25,454 44 |
| අත්තිකාරම් මුදල් ... ... ... | 76,189 57 |
| වැඩිපුර ගෙවන ලද මුදල් අයකිරීම ... ... | 60 30 |
| තිර තැන්පත් ... ... ... | 51,250 0 |
| විදුලිය යෝජනා ක්‍රමයේ අගය අඩුවීම ... ... | 2,000 0 |
| 1970.12.31 දිනට ඉතිරි ... ... | 1,88,050 32 |
| | 12,36,891 99 |

| වැය ශීර්ෂය | වියදම රු. ශ. |
|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම ... ... | 1,42,367 97 |
| බී.—පොදු මංමාවත් ... ... ... | 98,311 28 |
| සී.—තානායම් හා අම්බලම ... ... | — |
| ඩී.—නගර සභා ඉඩම හා ගොඩනැගිලි ... ... | 40,171 88 |
| ඊ.—මහජන සුවය ... ... ... | 2,30,036 20 |
| ඇෆ්.—පොදු විනෝද කටයුතු ... ... | 1,378 0 |
| ජී.—සොහොන් බිම් ... ... ... | 3,859 26 |
| එච්.—බල්ලන් ලියාපදිංචි කිරීම ... ... | — |
| අයි.—තරාදි පඩි සහ සේරු ... ... | — |
| ජේ.—විදුලිය දෙපාර්තමේන්තුව ... ... | 3,55,320 73 |
| කේ.—ගිනි නිවීමේ කටයුතු ... ... | — |
| එල්.—පලතුරු ගස් සැපයීම ... ... | — |
| එම්.—කියවීම්ශාලා ... ... ... | 14,298 19 |
| | 8,85,743 51 |
| වෙනත් වැයවීම්— | |
| තැන්පත් මුදල් ... ... ... | 1,21,552 17 |
| අත්තිකාරම් මුදල් ... ... ... | 67,459 02 |
| වැඩිපුර ගෙවීම් අයකිරීම ... ... | 60 30 |
| තිර තැන්පත් ... ... ... | 1,00,000 0 |
| විදුලි දෙපාර්තමේන්තුවේ ක්ෂය සංචිතය ... | 2,000 0 |
| 1971.12.31 දිනට ඉතිරි ... ... | 60,076 99 |
| | 12,36,891 99 |

වත්තල – මාබෝලෙ නගර සභාවේ සභාපති, පි. ආර්. පර්සි ඩයස් වන මම, මගේ දැනීම හා විශ්වාසය පරිදි ඉහතින් දක්වා ඇති වත්තල–මාබෝලෙ නගර සභාවේ 1971.12.31 අවසාන් වන වර්ෂයේ ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශනය සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි.

පි. ආර්. පර්සි ඩයස්,
සභාපති, වත්තල–මාබෝලෙ නගර සභාව.

හැරල්ඩ් ප්‍රනාන්දු,
අංක 5 කොට්ඨාශයේ නියෝජිත.

1972 ජූලි මස 28 වැනි දින මා ඉදිරිපිටදී සහතික කරන ලදි

1972 ජූලි මස 28 වැනි දින,
වත්තල–මාබෝලෙ නගර සභා කාර්යාලය.

ආර්. ඒ. ගුණවර්ධන,
සමාදාන විනිශ්චයකාර තැන.

12–312—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

# අය-වැය ලේඛන

## කෑගල්ල නගර සභාව

පළමුවන පරිපූරක අය-වැය ලේඛනය—1973
විදුලි අය-වැය ලේඛනය

1 වන කොටස—පුනරාවර්තන වියදම්

| වැය ශීර්ෂය | මුදල රු. | ශ. | සභා සම්මුති අංකය හා දිනය |
|---|---|---|---|
| විදු.—(3) (එච්) විශ්‍රාම වැටුප්, පාරිතෝෂික මුදල් සහ අර්ථසාධක අරමුදලට දයක මුදල් ... | 4,000 | 0 | ... 1973.09.27 දින අංක 31 |
| විදු.—(5) (බී) විවිධ ගාස්තු ... ... ... ... ... | 2,000 | 0 | ... 1973.09.27 දින අංක 31 |

ඉහත සඳහන් ප්‍රකාර සම්මත වී ඇත.

පු. බ. බාලසූරිය,
සභාපති,
කෑගල්ල නගර සභාව.

1973 නොවැම්බර් මස 30 වැනි දින,
කෑගල්ල, නගර සභා කාර්යාලයේ දීය.

12-349/1—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

## කෑගල්ල නගර සභාව

නගර සභා මුදල් රෙගුලාසි රෙගුලාසි 12(II) යටතේ අයදුම් පත—2

**1973 අය-වැය ලේඛනය**

1973 අය-වැය ලේඛනයේ පහත සඳහන් වැය ශීර්ෂයන් යටතේ ඉතිරිවේයැයි ගණන් බලන ලද මුදල්, ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂයන්ට මාරු කර, අවශ්‍යව තිබෙන අතිරේක වැය සඳහා එම ශීර්ෂ යටතේ යෙදවීමට 1973 සැප්තැම්බර් මස 27 වැනි දින අංක 30 සහ 1973 ඔක්තෝබර් මස 26 වැනි දින අංක 27(2) සහ 27(4) දරණ සම්මුතියන්ගෙන් සභා සම්මත විය.

සාමාන්‍ය අංශය

| මුදල් ඉතිරිවන වැය ශීර්ෂ | රු. | ශ. |
|---|---|---|
| බී.—(12) අලුත් කර්මාන්ත ... ... | 11,000 | 0 |
| බී.—(12) අලුත් කර්මාන්ත ... ... | 30 | 0 |
| ර්.—(1) (සී) නිල ඇඳුම් ... ... ... | 150 | 0 |
| ර්.—(7) (බී) ඉදි කිරීම ... ... ... | 11,000 | 0 |
| එකතුව ... | 22,180 | 0 |

| මුදල් අවශ්‍ය වන වැය ශීර්ෂ | රු. | ශ. |
|---|---|---|
| ජී.—(1) (ඊ) විශ්‍රාම වැටුප් ... ... | 8,000 | 0 |
| ජී.—(2) (ඒ) දීමනා ... ... ... | 150 | 0 |
| ජී.—(2) (බී) ගමන් ගාස්තු ... ... | 500 | 0 |
| ජී.—(2) (එච්) කරත්ත හා බෝට්ටු තහඩු ගාස්තු ... | 30 | 0 |
| ජී.—(2) (ඩී) නක්සේරුකරුවන්ගේ ගාස්තු ... | 3,500 | 0 |
| ජී.—(2) (ඇෆ්) ලිපි ද්‍රව්‍ය සහ මුද්‍රණ ... ... | 3,000 | 0 |
| ජී.—(3) ආපසු ගෙවීම් ... ... ... | 1,500 | 0 |
| ජී.—(8) සතුකොට ගැනීම ... ... | 1,000 | 0 |
| සී.—(3) දූව බඩු සහ උපකරණ ... ... | 2,000 | 0 |
| ර්.—(3) (ඒ) ඉදි කිරීම ... ... ... | 2,500 | 0 |
| එකතුව ... | 22,180 | 0 |

පු. බ. බාලසූරිය,
සභාපති,
කෑගල්ල නගර සභාව.

1973 නොවැම්බර් මස 30 වැනි දින,
කෑගල්ල නගර සභා කාර්යාලයේ දීය.

12-349/2—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

## කලවාකැලේ-ලිඳුල නගර සභාව

1973 වර්ෂයේ අංක 2 දරණ පරිපූරක අය වැය ලේඛනය

| වැය ශීර්ෂය | මුදල රු. | ශ. |
|---|---|---|
| බී.—(2) ... ... ... ... | 4,260 | 0 |
| බී.—(8) ... ... ... ... | 85 | 0 |
| ජී.—(2) (බී) ... ... ... | 3,815 | 0 |
| ජී.—(2) (එෆ්) ... ... ... | 8,566 | 0 |
| ඩී.—(2) ... ... ... ... | 675 | 0 |
| ඩී.—(3) ... ... ... ... | 1,420 | 0 |
| ර.—(1) (සී) ... ... ... | 700 | 0 |
| ර.—(1) (ජේ) ... ... ... | 85 | 0 |
| ර.—(2) (එෆ්) ... ... ... | 110 | 0 |
| ර්.—(5) (සී) ... ... ... | 845 | 0 |
| ර්.—(6) (බී) ... ... ... | 735 | 0 |
| ඩී.—(4) ... ... ... ... | 13,812 | 0 |

1973 ඔක්තෝබර් 13 වැනි දින සාමාන්‍ය සභා රැස්වීමේ අංක 12 දරණ සම්මුතියෙන් සභා සම්මත කර ගන්නා ලදී.

ර්. වණිගසේකර,
සභාපති,
කලවාකැලේ-ලිඳුල නගර සභාව.

1973 නොවැම්බර් මස 29 වැනි දින,
කලවාකැලේ-ලිඳුල,
නගර සභා කාර්යාලයේ දී ය.

එම විදුලිය

| | | රු. | ශ. |
|---|---|---|---|
| 1. | (බී) නොග විදුලිය සඳහා ... ... | 29,188 | 0 |
| 3. | (ඒ) ... ... ... | 2,676 | 0 |
| 3. | (එච්) ... ... | 1,199 | 0 |
| 3. | (ජේ) ... ... | 4,104 | 0 |
| 4. | (සී) ... ... ... | 179 | 0 |
| 8. | (ඒ) ණය ආපසු ... ... | 115 | 0 |

1973 ඔක්තෝබර් 13 වැනි දින සාමාන්‍ය සභා රැස්වීමේ අංක 12 දරණ සම්මුතියෙන් සභා සම්මත කරගන්නා ලදී.

ර්. වණිගසේකර,
සභාපති,
කලාවාකැලේ-ලිඳුල නගර සභාව.

1973 නොවැම්බර් මස 29 වැනි දින,
කලවාකැලේ-ලිඳුල,
නගර සභා කාර්යාලයේ දී ය.

12-326—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

### තිස්සමහරාම සුළු නගර සභාව
### 1973 වර්ෂයේ II වැනි පරිපූරක වැය ලේඛනය
### I වැනි කොටස—සාමාන්‍ය අංශය

වැය ශීර්ෂය

| | රු. | ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම :— | | |
| 1. නිලධාරි වැටුප්— | | |
| (බී) කාර්යාල කාර්ය සහායකයෝ ... ... ... ... ... ... | 165 | 0 |
| 2. කාර්ය මණ්ඩලයේ වියදම— | | |
| (එෆ්) ලිපි ද්‍රව්‍ය මුද්‍රණ ප්‍රකාශන සහ මුද්දර ගාස්තු ... ... ... ... ... | 750 | 0 |
| බී.—මංමාවත් :— | | |
| 1. වේතන සහ දෛනික වැටුප්— | | |
| (බී) පාලකවරු ... ... ... ... ... ... ... | 1,355 | 0 |
| සී.—සභා ඉඩම සහ ගොඩනැගිලි :— | | |
| 1. දෛනික වැටුප් ... ... ... ... ... ... ... | 645 | 0 |
| ඩී.—මහජන සෞඛ්‍ය :— | | |
| 1. සාමාන්‍ය— | | |
| (බී) දෛනික වැටුප් ... ... ... ... ... ... ... | 145 | 0 |
| 2. කැලිකසළ ශෝධනය— | | |
| (ඒ) දෛනික වැටුප් ... ... ... ... ... ... ... | 405 | 0 |
| 3. වැසිකිළි ශෝධනය— | | |
| (ඒ) දෛනික වැටුප් ... ... ... ... ... ... ... | 385 | 0 |
| 5. ජල සම්පාදනය— | | |
| (ඒ) දෛනික වැටුප් ... ... ... ... ... ... ... | 200 | 0 |
| එකතුව ... | 4,050 | 0 |

### II වැනි කොටස—විදුලි අංශය

| | රු. | ශ. |
|---|---|---|
| 8. ණය මුදල ආපසු ගෙවීම— | | |
| (ඒ) මුල් මුදල ... ... ... ... ... ... ... | 2,555 | 0 |
| එකතුව ... | 2,555 | 0 |

**1973** නොවැම්බර් මස 17 වැනි දින අංක 80 **තීරණයෙන්** හම්බන්තොට පළාත් පාලන සහකාර කොමසාරිස් තුමාගේ සංශෝධනයන්ට සහ අනුමැතියට යටත්ව තීරණය කරන ලදී.

ආර්. විජේදාස,
පරිපාලන නිලධාරි,
සුළු නගර සභාව,
තිස්සමහරාම.

**1973 නොවැම්බර් මස 17 වැනි දින,**
**තිස්සමහරාම සුළු නගර සභා කාර්යාලයේදීය.**

අනුමත කරමි.

එච්. ජී. ආනන්ද,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
හම්බන්තොට.

**1973 නොවැම්බර් මස 20 වැනි දින,**
**හම්බන්තොට,**
**පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේදීය.**

**12–340/1—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය**

---

### තිස්සමහරාම සුළු නගර සභාව
### 1973 අය වැය ලේඛනය
### මුදල් රෙගුලාසි 40 (II) යටතේ අයදුම් පත්‍රය

පහත සඳහන් වැය ශීර්ෂ යටතේ වූ ඉතිරිවේ යයි ගණන් බලන ලද ප්‍රතිපාදනයන් ඊට අනුරූපව දක්වෙන ශීර්ෂයන්ට මාරු කර අවශ්‍ය වී ඇති අතිරේක වැය සඳහා එම ශීර්ෂය යටතේ ප්‍රතිපාදනය කර වැය කිරීමට හම්බන්තොට පළාත් පාලන සහකාර කොමසාරිස් තුමාගේ සංශෝධනයන්ට සහ අනුමැතියට යටත්ව 1973.11.17 වැනි දින සහ අංක 79 දරණ තීරණයෙන් සම්මත කරන ලදී.

සාමාන්‍ය අංශය

| මුදල් ඉතිරි වැය ශීර්ෂ | රු. | ශ. | මුදල් අවශ්‍ය වැය ශීර්ෂ | රු. | ශ. |
|---|---|---|---|---|---|
| ඒ.—1 (බී) ... ... ... | 900 | 0 | ඒ.—1 (එච) ... ... ... | 75 | 0 |
| ඒ.—1 (සී) ... ... ... | 900 | 0 | ඒ.—2 (බී) ... ... ... | 600 | 0 |
| ඒ.—2 (ඊ) ... ... ... | 1,000 | 0 | ඒ.—2 (එෆ්) ... ... ... | 250 | 0 |
| බී.—1 (සී) ... ... ... | 1,000 | 0 | ඒ.—2 (අයි) ... ... ... | 175 | 0 |
| බී.—(2) ... ... ... | 1,000 | 0 | බී.—(4) ... ... ... | 3,200 | 0 |
| ඩී.—1 (එෆ්) ... ... ... | 950 | 0 | බී.—(12) ... ... ... | 380 | 0 |
| ඩී.—1 (එච්) ... ... ... | 400 | 0 | සී.—(4) ... ... ... | 970 | 0 |
| ඩී.—2 (බී) ... ... ... | 500 | 0 | සී.—(7) ... ... ... | 500 | 0 |
| ඩී.—3 (බී) ... ... ... | 500 | 0 | ඩී.—1 (බී) ... ... ... | 300 | 0 |
| ඩී.—3 (ට) ... ... ... | 1,000 | 0 | ඩී.—2 (ඒ) ... ... ... | 1,335 | 0 |
| ඩී.—5 (බී) ... ... ... | 2,400 | 0 | ඩී.—3 (ඒ) ... ... ... | 1,210 | 0 |
| ඩී.—7 (බී) ... ... ... | 3,000 | 0 | ඩී.—5 (සී) ... ... ... | 3,650 | 0 |
| ජී.—(1) ... ... ... | 500 | 0 | ඩී.—7 (බී) ... ... ... | 500 | 0 |
| | | | ජේ.—(1) ... ... ... | 320 | 0 |
| | | | ජේ.—(2) ... ... ... | 85 | 0 |
| | | | ජේ.—(3) ... ... ... | 500 | 0 |
| | 14,050 | 0 | | 14,050 | 0 |

විදුලි අංශය

මුදල් ඉතිරි වැය ශීර්ෂ

| | රු. | ශ. |
|---|---|---|
| 3. (එච්) ... ... ... | 400 | 0 |
| 3. (එන්) ... ... ... | 900 | 0 |
| 4. (බී) ... ... ... | 150 | 0 |
| 5. (බී) ... ... ... | 1,000 | 0 |
| 6. (ඒ) (1) ... ... ... | 1,750 | 0 |
| 7. (ඊ) ... ... ... | 100 | 0 |
| 13. ... ... ... | 500 | 0 |
| 14. ... ... ... | 300 | 0 |
| 16. ... ... ... | 7,250 | 0 |
| | 12,350 | 0 |

මුදල් අඩුකළ වැය ශීර්ෂ

| | රු. | ශ. |
|---|---|---|
| 1. (ඒ) ... ... ... | 6,220 | 0 |
| 1. (බී) ... ... ... | 125 | 0 |
| 3. (ඒ) ... ... ... | 790 | 0 |
| 3. (ඊ) ... ... ... | 500 | 0 |
| 3. (ජේ) ... ... ... | 720 | 0 |
| 3. (එල්) ... ... ... | 150 | 0 |
| 3. (කිව්) ... ... ... | 600 | 0 |
| 4. (ඒ) ... ... ... | 1,795 | 0 |
| 4. (සී) ... ... ... | 250 | 0 |
| 17. ... ... ... | 1,200 | 0 |
| | 12,350 | 0 |

ආර්. විජේදය,
පරිපාලන නිලධාරි,
තිස්සමහාරාම සුළු නගර සභාව.

1973 නොවැම්බර් මස 17 වැනි දින,
තිස්සමහාරාම සුළු නගර සභා කාර්යාලයේදිය.

අනුමත කරමි.

එච්. පී. ආනන්ද,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
හම්බන්තොට.

1973 නොවැම්බර් මස 20 වැනි දින,
හම්බන්තොට, පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේදිය.

12–340/2—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

පොලොන්නරුව සුළු නගර සභාව
1973 වර්ෂයේ I වෙනි පරිපූරක වැය ලේඛනය
පළමුවෙනි කොටස—සාමාන්‍ය

| වියදම් ශීර්ෂය | රු. | ශ. | යෝජනා අංකය හා සම්මත වූ දිනය |
|---|---|---|---|
| ඒ.—(1) (එෆ්) විශ්‍රාම වැටුප් ... ... | 600 | 0 | 3—1973.09.04 |
| ඒ.—(2) (බී) ගමන් ගාස්තු ... ... | 1,500 | 0 | එම |
| ඒ.—(2) (එෆ්) ලිපිද්‍රව්‍ය හා තැපැල් ගාස්තු ... | 3,500 | 0 | එම |
| ඒ.—(2) (එම්) අතිකාල දීමනා ... ... | 1,000 | 0 | එම |
| ඒ.—(2) (ජේ) හදිසි වියදම් ... ... | 300 | 0 | එම |
| ඒ.—(4) ආධාර හා පරිත්‍යාග ... ... | 500 | 0 | එම |
| සී.—(7) ගොඩනැගිලි හා ඉඩම් ... ... | 6,000 | 0 | එම |
| ඩී.—(1) (එච්) කාණු ඉදිකිරීම් ... ... | 3,800 | 0 | එම |
| ඩී.—(2) (බී) ගොන් කරත්ත හා ලොරි ... ... | 15,000 | 0 | එම |
| ඩී.—(2) (සී) ගබඩා ... ... ... | 2,000 | 0 | එම |
| ඩී.—(3) (සී) ගබඩා ... ... ... | 2,000 | 0 | එම |
| ඩී.—(6) (බී) රෝහල් ... ... ... | 6,000 | 0 | එම |
| එකතුව ... | 42,200 | 0 | |

දෙවෙනි කොටස—විදුලි අංශය

| | රු. | ශ. | |
|---|---|---|---|
| (3) (ඊ) ගමන් වියදම් ගාස්තු ... ... | 700 | 0 | 3—1973.09.04 |
| (3) (එච්) විශ්‍රාම වැටුප් ... ... ... | 1,000 | 0 | එම |
| එකතුව ... | 1,700 | 0 | |

පු. ලි. බෞද්ධසාර,
සභාපති,
පොලොන්නරුව සුළු නගර සභාව.

1973 නොවැම්බර් මස 24 වෙනි දින,
පොලොන්නරුව සුළු නගර සභා කාර්යාලයේදිය.

12–336/1—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

## පොලොන්නරුව සුළු නගර සභාව

මුදල් රෙගුලාසි අංක 40 (II) යටතේ කෙරෙන අයදුම් පත්‍රය

අය-වැය ලේඛණය—1973

1973 වර්ෂයේ අය-වැය ලේඛණයේ ඒ ඒ වැය ශීර්ෂයන් යටතේ වෙන් කරන ලද මුදලින් ඉතිරි වෙතැයි ගණන් බලන ලද පහත දැක්වෙන වැය ශීර්ෂයන් යටතේ වූ මුදල ඊට අනුරූපව දැක්වෙන වැය ශීර්ෂයන්ට මාරුකර අවශ්‍ය ව තිබෙන වැය සඳහා එම ශීර්ෂයන් යටතේ යෙදවීමට 1973 ඔක්තෝබර් 31 වෙනි දින පවත්වන්නට යෙදුන සාමාන්‍ය මාසික සභා රැස්වීමේදී අංක 4 දරණ යෝජනාවෙන් සභා සම්මත විය.

1 වෙනි කොටස—සාමාන්‍ය

| මුදල් ඉතිරි වැය ශීර්පය | රු. | ශ. | මුදල් අවශ්‍ය වැය ශීර්ෂය | රු. | ශ. |
|---|---|---|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් : | | | | | |
| (1) ඒ—ලේකම් වැටුප්... ... ... | 1,000 | 0 | ඩී–3—කරත්ත හා ලොරි—බී ... ... | 2,000 | 0 |
| බී—ලිපිකරු වැටුප් ... ... | 1,000 | 0 | ඩී–3—ගබඩා උපකරණ—සී ... ... | 500 | 0 |
| බී—2 මංමාවත් නඩත්තුව ... ... | 2,000 | 0 | ඒ–2—මුද්‍රණ ලිපිද්‍රව්‍ය හා තැපැල් ගාස්තු—එෆ් ... | 1,000 | 0 |
| | | | ඒ–2—අතිකාල දීමනා—එම ... ... | 500 | 0 |
| එකතුව ... | 4,000 | 0 | එකතුව ... | 4,000 | 0 |

2 වෙනි කොටස—විදුලි අංශය

| | | | | | |
|---|---|---|---|---|---|
| වි.දෙ. (4) වැටුප් හා වේතන—ඒ ... ... | 3,000 | 0 | වි.දෙ. (3) ගමන් වියදම් ගාස්තු—ඊ ... ... | 1,000 | 0 |
| | | | වි.දෙ. (3) ලිපි ද්‍රව්‍ය මුද්‍රණ ගාස්තු—ජේ ... ... | 1,500 | 0 |
| | | | වි.දෙ. (3) විශ්‍රාම වැටුප්—එච් ... ... | 500 | 0 |
| එකතුව ... | 3,000 | 0 | එකතුව ... | 3,000 | 0 |

පු. ලි. බෞද්ධසාර,
සභාපති,
පොලොන්නරුව සුළු නගර සභාව

1973 නොවැම්බර් මස 24 වෙනි දින,
පොලොන්නරුව සුළු නගර සභා කාර්යාලයේ දී ය.

12–336/2—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

## දඹුල්ල සුළු නගර සභාව

සුළු නගර සභා මුදල් රෙගුලාසි අංක 40(II) යටතේ අයදුම්පත් අංක 1

1973 අයවැය ලේඛනයේ පහත සඳහන් වැය ශීර්ෂයන් යටතේ ඉතිරි වෙතැයි ගණන් බලන ලද මුදල් ඊට අනුරූපව දැක්වෙන වැය ශීර්ෂයන්ට මාරු කර අවශ්‍යව තිබෙන අතිරේක වැය සඳහා එම ශීර්ෂයන් යටතේ යෙදවීමට 1973 ඔක්තෝබර් 30 වැනි දින අංක 2(2) දරණ යෝජනාවෙන් සභා සම්මත විය.

| මුදල් ඉතිරි වැය ශීර්ෂ | රු. | ශ. | අතිරේක මුදල් අවශ්‍ය වැය ශීර්ෂ | රු. | ශ. |
|---|---|---|---|---|---|
| ඒ.—(1) (ඒ) ලේකම් වැටුප් ... ... | 1,000 | 0 | ඒ.—(1) (ඩී) වැටුප් කා.කා. සහායක ... ... | 50 | 0 |
| ඒ.—(1) (එෆ්) විශ්‍රාම වැටුප් ... ... | 400 | 0 | ඒ.—(2) (බී) ගමන් ගාස්තු ... ... | 400 | 0 |
| ඒ.—(2) (ජී) කරත්ත සහ බෝට්ටු ... ... | 75 | 0 | ඒ.—(2) (ඩී) තක්සේරු කරන්නන්ගේ ගාස්තු ... | 1,200 | 0 |
| ඒ.—(3) ආපසු ගෙවීම් ... ... ... | 50 | 0 | ඒ.—(2) (ඊ) නීතියේ කටයුතු ... ... | 150 | 0 |
| බී.—(1) (ඩී) ඕවර්සියර් වැටුප් ... ... | 350 | 0 | ඒ.—(2) (එෆ්) ලිපි ද්‍රව්‍ය, මුද්‍රණ වැඩ හා කාර්‍යාල වියදම ... | 2,000 | 0 |
| බී.—(2) නඩත්තු කිරීම් ... ... ... | 150 | 0 | ඒ.—(2) (ජේ) හදිසි වියදම් ... ... | 55 | 0 |
| බී.—(4) වීථි ආලෝක කිරීම ... ... | 3,000 | 0 | ඒ.—(2) (කේ) කාර්‍යාල උපකරණ ... ... | 100 | 0 |
| සී.—(4) නඩත්තු කිරීම් ... ... | 300 | 0 | සී.—(1) වේතන ... ... ... | 100 | 0 |
| ඩී.—(1) (සී) ආධාර ... ... ... | 180 | 0 | ඩී.—(1) (එන්) මාතෘදරකාභිවෘද්ධි මධ්‍යස්ථාන ... | 750 | 0 |
| ඩී.—(1) (එෆ්) විෂබීජ නාශක ද්‍රව්‍ය ... ... | 200 | 0 | ඩී.—(2) (ඒ) වේතන ... ... ... | 400 | 0 |
| ඩී.—(1) (ජේ) සෞඛ්‍ය සති වියදම් ... ... | 50 | 0 | ඩී.—(5) (ඒ) වේතන ... ... ... | 200 | 0 |
| ඩී.—(1) (කේ) කිරි වර්ග කිරීමේ වියදම් ... ... | 100 | 0 | ඩී.—(5) (සී) නඩත්තු කිරීම් ... ... | 1,400 | 0 |
| ඩී.—(2) (බී) කරත්ත, ගොනුන් සහ ලොරි ... | 100 | 0 | ඩී.—(7) (බී) නඩත්තු කිරීම් ... ... | 200 | 0 |
| ඩී.—(2) (සී) ගබඩා ... ... ... | 250 | 0 | | | |
| එෆ්.—(1) වේතන ... ... ... | 100 | 0 | | | |
| අයි.—(1) ගිනි නාශක බඩුන් ... ... | 200 | 0 | | | |
| ජේ.—(1) වේතන ... ... ... | 240 | 0 | | | |
| ජේ.—(4) දූවදඩු ... ... ... | 260 | 0 | | | |
| | 7,005 | 0 | | 7,005 | 0 |

හෙ. වි. ප්‍රේමතිලක,
සභාපති.

1973 නොවැම්බර් මස 09 වැනි දින,
දඹුල්ල සුළු නගර සභා කාර්‍යාලයේ දීය.

අනුමත කරමි.
කේ. ජී. ඩී. විමලසිරි,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
මාතලේ.

1973 නොවැම්බර් 24 වැනි දින,
මාතලේ පළාත් පාලන අමාත්‍යාංශ කාර්යාලයේ දීය.

12–301–73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

**මීරිගම සුළු නගර සභාව**

1973 (1) වැනි පරිපූරක අයවැය ලේඛනය—විදුලිය

**(11) වන කොටස—ප්‍රාග්ධන වියදම්**

| | රු. | ශ. |
|---|---|---|
| 9. විදුලිබල උප මධ්‍යස්ථාන ... ... | 25,000 | 0 |

පූර්වෝක්ත වැය ශීර්ෂය 1973 ඔක්තෝබර් මස 26 වැනි දින අංක 6–8(11) දරණ යෝජනාවෙන් සභා සම්මත විය.

ජේ. ඒ. අමරතුංග,
සභාපති,
මීරිගම සුළු නගර සභාව.

1973 නොවැම්බර් මස 23 වැනි දින,
මීරිගම සුළු නගර සභා කාර්යාලයේ දිය.

12–371—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

**කැළණිය සුළු නගර සභාව**

අංක 40(11) දරණ සුළු නගර සභා මුදල් රෙගුලාසි යටතේ කෙරෙන ඉල්ලීමයි

**1973 සාමාන්‍ය අයවැය ලේඛනය**

අන්‍ය වැය සම්මතයන්හි අනුරූප අතිරේක ප්‍රතිපාදනයන් සඳහා 1973 වාර්ෂික සාමාන්‍ය වැය සම්මතයන්ගෙන් ඉතිරිවේයයි ගණන් බලන ලද මුදල්, බටහිර කොට්ඨාශයේ පළාත් පාලන සහකාර කොමසාරිස්තුමාගේ අනුමතියට යටත්ව යෙදීමට, 1973 ඔක්තෝබර් මස 26 වෙනි දින පැවති සභා රැස්වීමේදී අංක 3(1) දරණ සභා සම්මුතියෙන් තීරණය විය.

**මුදල් ඉතිරිවේයයි ගණන් බලා ඇති ශීර්ෂ**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ.—(1) (ඒ) ලේකම් මහතාගේ වැටුප් ... ... | 616 | 0 |
| ඒ.—(2) (ජී) බලපත්‍ර තහඩු ගාස්තු ... ... | 246 | 50 |
| බී.—(3) යන්ත්‍ර සහ ආයුධ ... ... | 400 | 0 |
| බී.—(11) මැණීම ... ... ... | 900 | 0 |
| ඩී.—(1) (ඩී) නිල ඇඳුම ... ... ... | 130 | 50 |
| ඩී.—(1) (එෆ්) විෂබීජ නාශක ද්‍රව්‍ය ... ... | 1,500 | 0 |
| ඩී.—(2) (සී) ගබඩා ... ... ... | 400 | 0 |
| ඩී.—(3) (බී) කරත්ත සහ ලොරි ... ... | 500 | 0 |
| ඩී.—(3) (සී) ගබඩා ... ... ... | 20 | 0 |
| ඩී.—(5) (සී) ජල සම්පාදනය ... ... | 100 | 0 |
| එෆ්.—(2) සොහොන් බිම් නඩත්තු ... ... | 1,000 | 0 |
| ජී.—(1) බල්ලන් විනාශ කිරීම ... ... | 50 | 0 |
| ජේ.—(3) පුවත්පත් සහ සඟරා ... ... | 250 | 0 |
| | 6,113 | 0 |

**මුදල් අවශ්‍ය වන වැය ශීර්ෂ**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ.—(1) (සී) ආදායම් නිරී. වැටුප් ... ... | 260 | 0 |
| ඒ.—(1) (එෆ්) විශ්‍රාම වැටුප් ... ... | 300 | 0 |
| ඒ.—(2) (බී) ගමන් ගාස්තු ... ... ... | 600 | 0 |
| සී.—(1) මුරකරු වැටුප් ... ... ... | 56 | 0 |
| සී.—(7) වගා ව්‍යාපාරය සඳහා ... ... | 2,397 | 0 |
| ඩී.—(3) (ජී) වැසිකිළි පරිවර්තන ආධාර ... ... | 2,500 | 0 |
| | 6,113 | 0 |

එෆ්. එක්. ඩී. සිරිසේන,
සභාපති,
කැළණිය සුළු නගර සභාව.

1973 නොවැම්බර් මස 2 වැනි දින,
කැළණිය සුළු නගර සභා කාර්යාලයේ දීය.

අනුමත කරමි.

ග. දයානන්ද ද සිල්වා,
පළාත් පාලන සහකාර කොමසාරිස් (බ.කො.)

1973 නොවැම්බර් මස 23 වැනි දින,
කොළඹ දීය.

12–293—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

**හාලිඇල සුළු නගර සභාව**

දෙවැනි පරිපූරක අයවැය ලේඛනය—1973 සාමාන්‍ය අංශය

**1 වැනි කොටස—සාමාන්‍ය අංශය**

| වැය ශීර්ෂය | මුදල රු. | ශ. |
|---|---|---|
| ඒ.—(2) (ඩ) අතිකාල දීමනා ... ... | 400 | 0 |
| බී.—(11) මැණීම ... ... ... | 50 | 0 |
| සී.—(1) වේතන ... ... ... | 550 | 0 |
| ඩී.—(2) (සී) ගබඩා ... ... ... | 125 | 0 |
| ඩී.—(3) (ඒ) වේතන ... ... ... | 800 | 0 |
| ඩී.—(3) (බී) කරත්ත හා ගවයෝ ... ... | 200 | 0 |
| ඩී.—(3) (ජී) ඉඳි කිරීම ... ... ... | 350 | 0 |
| ඩී.—(5) (ඒ) වේතන ... ... ... | 725 | 0 |
| එකතුව ... | 3,200 | 0 |

පූර්වෝක්ත වැය ශීර්ෂ 1973 නොවැම්බර් මස 28 වැනි දින අංක 8(2) දරණ යෝජනාවෙන් සභා සම්මත කරන ලදී.

දි. ර.ආ. ප්‍රේමදාස,
හාලිඇල සුළු නගර සභාවේ සභාපති.

1973 දෙසැම්බර් මස 3 වැනි දින,
හාලිඇල සුළු නගර සභා කාර්යාලයේ දිය.

12–466/1—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

**හාලිඇල සුළු නගර සභාව**

දෙවැනි පරිපූරක අයවැය ලේඛනය—1973 විදුලි අංශය

**2 වැනි කොටස—විදුලි අංශය**

| වැය ශීර්ෂය | මුදල රු. | ශ. |
|---|---|---|
| (4) (එෆ්) විවිධ ගාස්තු (දීර්ඝ කිරීම හා දියුණු කිරීම) ... | 4,400 | 0 |

පූර්වෝක්ත වැය ශීර්ෂ 1973 නොවැම්බර් මස 28 වැනි දින අංක 8(2) දරණ යෝජනාවෙන් සභා සම්මත කරන ලදී.

දි. ර. ආ. ප්‍රේමදාස,
හාලිඇල සුළු නගර සභාවේ සභාපති.

1973 දෙසැම්බර් මස 3 වැනි දින,
හාලිඇල සුළු නගර සභා කාර්යාලයේ දිය.

12–466/2—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

### හාලි ඇල සුළු නගර සභාව

මුදල් රෙගුලාසි අංක 40(II) යටතේ කෙරෙන අයදුම් පත

**1973 අය වැය ලේඛනය**

1973 වර්ෂයේ අය වැය ලේඛනයේ ඒ ඒ වැය ශීර්ෂයන් යටතේ වෙන් කරන ලද මුදලින් ඉතිරිවෙයයි ගණන් බලන ලද පහත විස්තර දක්වෙන වැය ශීර්ෂයන් යටතේ ඇති මුදල් ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂයන්ට මාරු කර අවශ්‍ය වී ඇති වැය සඳහා එම ශීර්ෂයන් යටතේ යෙදවීමට 1973 නොවැම්බර් මස 28 දින පවත්වන්නට යෙදුන මාසික සභා රැස්වීමේදී අංක 8(1) දරණ යෝජනාවෙන් සභා සම්මත විය.

1 වැනි කොටස—සාමාන්‍ය

| ඉතිරිවෙයයි ගනන් බලා ඇති වැය ශීර්ෂ | රු. | ශ. | මුදල් අවශ්‍ය වී ඇති වැය ශීර්ෂ | රු. | ශ. |
|---|---|---|---|---|---|
| ඒ.—1 (ඒ) ලේකම් වැටුප් ... ... | 400 | 0 | ඒ.—1 (බී) ලිපිකරු වැටුප්... ... ... | 200 | 0 |
| ඩී.—1 (කේ) කිරි වර්ග කිරීම සඳහා වියදම් ... | 400 | 0 | ඒ.—1 (ඩී) පියන්වරු ... ... ... | 500 | 0 |
| ඩී.—1 (එන්) මාතෘ නිවාස ... ... | 1,000 | 0 | ඒ.—2 (ඕ) බදු එකතු කරන්නන් සඳහා කොමිස් ... | 300 | 0 |
| ජී.—1 බල්ලන් විනාශ කිරීම ... ... | 200 | 0 | ඒ.—2 (එෆ්) ලිපි ද්‍රව්‍ය, මුද්‍රණ ප්‍රසිද්ධ කිරීම සහ මුද්දර ... | 500 | 0 |
| | | | ඒ.—2 (අයි) නිවාඩු දුම්රිය ප්‍රවේශ පත්‍ර ... ... | 200 | 0 |
| | | | බී.—1 (බී) ඔවර්සියර් වැටුප් ... ... | 300 | 0 |
| එකතුව ... | 2,000 | 0 | එකතුව ... | 2,000 | 0 |

2 වැනි කොටස—විදුලිය

| | | | | | |
|---|---|---|---|---|---|
| 6. (ඒ) (II) නඩත්තු කිරීම සඳහා ... ... | 275 | 0 | 3. (ඒ) වැටුප් හා වේතන ... ... ... | 25 | 0 |
| 4. (එෆ්) විවිධ ගාස්තු දීර්ඝ කිරීම සහ දියුණු කිරීම ... | 355 | 69 | 3. (ජී) නිදහස් දුම්රිය බලපත්‍ර ... ... | 200 | 0 |
| | | | 4. (සී) අතිකාල දීමනා ... ... ... | 50 | 0 |
| | | | 8. (ඒ) ණය මුදල් ආපසු ගෙවීම ... ... | 355 | 69 |
| එකතුව ... | 630 | 69 | එකතුව ... | 630 | 69 |

දි. ර. ආ. ප්‍රේමදාස,
හාලි ඇල සුළුනගර සභාවේ සභාපති.

1973 නොවැම්බර් මස 3 දින,
හාලි ඇල,
සුළුනගර සභා කාර්යාලයේ දීය.

12–465—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

### ගලේවෙල සුළු නගර සභාව

සුළු නගර සභා මුදල් රෙගුලාසි 40 (II) යටතේ ඉල්ලුම් පත්‍රය

**1973 සාමාන්‍ය අය වැය ලේඛනය**

1973 අය වැය ලේඛනයේ මුදල් ඉතිරිවෙයැයි ගණන් බලා ඇති වැය ශීර්ෂයන්ගෙන් වැය ඉක්මවායයි ගණන් බලා ඇති වැය ශීර්ෂයන්ට මෙහි පහත සඳහන් පරිදි මුදල් මාරු කිරීමට 1973 ඔක්තෝබර් මස 30 වන දින පැවති මාසික රැස්වීමේදී අංක 15 දරණ යෝජනාවෙන් සභා සම්මත විය.

| ඉතිරිවෙයයි ගණන් බලා ඇති ශිර්ෂය හා මුදල | රු. | ශ. | වැය ඉක්මවායයි ගණන් බලා ඇති ශීර්ෂය හා මුදල | රු. | ශ. |
|---|---|---|---|---|---|
| ෆී.—(12) නව කර්මාන්ත ... ... | 1,069 | 50 | ඒ.—(1) (ඒ) වැටුප් ලේකම් ... ... | 42 | 0 |
| | | | ඒ.—(1) (බී) ලිපිකරුවෝ ... ... | 180 | 0 |
| | | | ඒ.—(1) (සී) ආදායම් පරීක්ෂකයෝ ... ... | 120 | 0 |
| | | | ඒ.—(1) (ඩී) කාර්යාල කාර්‍ය සහායකයෝ ... | 82 | 50 |
| | | | සී.—(1) වැටුප් ... ... | 82 | 50 |
| | | | ඞී.—(1) (සී) වැටුප් කම්කරුවෝ ... ... | 60 | 0 |
| | | | ඩී.—(2) (ඒ) වැටුප් ... ... ... | 180 | 0 |
| | | | ඩී.—(3) (ඒ) වැටුප් ... | 240 | 0 |
| | | | ජේ.—(1) වේතන ... ... | 82 | 50 |
| එකතුව ... | 1,069 | 50 | එකතුව ... | 1,069 | 50 |

**1973 විදුලිය අය වැය ලේඛනය**

| | රු. | ශ. | | රු. | ශ. |
|---|---|---|---|---|---|
| 1.—(බී) උපරිම අවශ්‍යතා ගාස්තු ... ... | 277 | 50 | 3.—(ඒ) වැටුප් සහ වේතන ... ... | 132 | 50 |
| | | | 4.—(ඒ) වැටුප් සහ වේතන ... ... | 145 | 0 |
| එකතුව ... | 277 | 50 | එකතුව ... | 277 | 50 |

ල. ජ. ද සිල්වා වික්‍රමසූරිය,
සභාපති, ගලේවෙල සුළු නගරසභාව,

වර්ෂ 1973 ක්වූ නොවැම්බර් මස 20 වැනි දින,
ගලේවෙල සුළු නගර සභා කාර්යාලයේ දීය.

12–320—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය,

## අය වැය ලේඛනය—මාවනැල්ල නගරය

සුළු නගර සභා මුදල් රෙගුලාසි අංක 40 (ii) යටතේ වූ අයැදුම් පත්‍රය—අය වැය ලේඛනය—1973

### I වෙනි කොටස—සාමාන්‍ය අංශය

1973 වර්ෂයේ අය වැය ලේඛනයේ ඒ ඒ ශීර්ෂ යටතේ වෙන් කරන ලද මුදල් වලින් ඉතිරි වේ යැයි ගණන් බලන ලද පහත දැක්වෙන ශීර්ෂ යටතේ මුදල් ඊට අනුරූපව දැක්වෙන ශීර්ෂ වලට මාරු කර අවශ්‍යව තිබෙන අතිරේක වැය සඳහා එම ශීර්ෂ යටතේ යෙදීමට ට විසින් තීරණය කරන ලදී.

**මුදල් ඉතිරි වැය ශීර්ෂ**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් : | | |
| 1. සේවකයින්ගේ වැටුප්— | | |
| (එෆ්) විශ්‍රාම වැටුප් ... ... | 2,000 | 0 |
| 2. කාර්යාල මණ්ඩලයේ වියදම්— | | |
| (ඩී) තක්සේරු කරන්නන්ගේ ගාස්තු ... ... | 1,400 | 0 |
| ඩී.—සනීපාරක්ෂාව : | | |
| 1. සාමාන්‍ය— | | |
| (එන්) මාතෘ නිවාසය හා දාරකාභිවෘද්ධි නිවාස ... | 625 | 0 |
| 5. ජල සම්පාදනය— | | |
| (ඊ) ඉදි කිරීම ... ... ... | 2,000 | 0 |
| | 6,025 | 0 |

**මුදල් අවශ්‍ය වැය ශීර්ෂ**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් : | | |
| 1. සේවකයින්ගේ වැටුප් | | |
| (ටී) ලිපිකරුවන් ... ... | 500 | 0 |
| (සී) ආදායම් පරීක්ෂකයින් ... ... | 100 | 0 |
| (එච්) පළාත් පාලන නිලධාරී ... ... | 25 | 0 |
| 2. කාර්යාල මණ්ඩලයේ වියදම්— | | |
| (බී) ගමන් ගාස්තු ... ... ... | 500 | 0 |
පිදුරු ගබඩා කර තබා ගැනීම

පාවිච්චි කළ ඇඳුම් ගබඩා කර තබා ගැනීම

කුලියට දීම සඳහා ලාම්පු ගබඩා කර තබා ගැනීම

ධාන්‍ය හෝ මාෂ බෝග හොන්ඩර් 5 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම.

යන්ත්‍රෝපකරණ පාවිච්චි කරණ ලී ඉරුම් මෝලක් පවත්වාගෙන යාම.

අතින් ලී ඉරන ඉරුම් හලක් හෝ ඉරුම් මෝලක් පවත්වාගෙන යාම.

දැව ගබඩාවක් පාවත්වාගෙන යාම.

දර ගබඩාවක් පවත්වාගෙන යාම.

හිරිගල් හෝ හුණුගල් සඳහා හෑරීම.

යන්ත්‍රෝපකරණ පාවිච්චි කරණ කම්හලක් පවත්වාගෙන යාම.

යන්ත්‍රඋපකරණ පාවිච්චි නොකෙරෙන කම්මලක් පවත්වාගෙන යාම.

තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි හොණ්ඩර 15 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

හිස් බෝතල් හෝ හිස් ගෝනි ගබඩා කර තබා ගැනීම.

බයිසිකල් හෝ මෝටර් බයිසිකල් අලුත් වැඩියා කිරීම සඳහා වැඩපලක් පවත්වාගෙන යාම.

අලුත් හෝ පාවිච්චි කරනලද රබර් ටයර් හෝ ටියුබ් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

පොල්කටු ගබඩා කර තබා ගැනීම.

ගෙන්දගම් හෝ ගෙන්දගම් කුඩු හොන්ඩර 1 ට වැයි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

පාවිච්චි කරනලද කඩදසි හෝ පත්‍ර කඩදසි හෝ ගබඩා කර තබා ගැනීම.

විසිරි පින්තාරු කිරීම (ස්ප්‍රේ පේන්ටිං) සඳහා ආයතනයක් පවත්වාගෙන යාම

අත්යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් නූල් කැටීම හෝ විවීම.

අත්යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් රෙදි නිපදවීම.

සිල්ක් සහ කෘතිම රෙදි විවීම සහ විසිතුරු කිරීම.

මැසූ ඇඳුම් නිෂ්පාදනය කිරීම.

මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.

**II වැනි කොටස**

**අප්‍රසන්න ව්‍යාපාර**

මිනිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

පෝර හෝ රසායන පෝර නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

හම් පදම් කරණ ස්ථානයක් පවත්වාගෙන යාම.
හම් ගබඩා කර තබා ගැනීම.

උම්බලකඩ නිෂ්පාදනය කිරීම හෝ හොණ්ඩර 5 ට වැඩි උම්බලකඩ ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

කුකුලන් 100 ට වැඩි ගණනක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පවත්වාගෙන යාම

බැටළුවන්, එළුවන් හෝ ඌරන් දහයකට වැඩි ගණනක් සඳහා මඩුවක් හෝ ගාලක් පවත්වාගෙන යාම.

රබර් නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

පශු වෛද්‍ය ගිලන් හලක් පවත්වාගෙන යාම.

පුවක් සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග සහ ආහාර ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම.

කරවල, ලුණු මාළු හෝ ජාඩි හොන්ඩර 3 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේලීම හෝ අයිස් දැමීම.

අඟුරු සඳහා දැව හෝ පොල්කටු දැවීම හෝ අඟුරු ගබඩා කර තබා ගැනීම

සිමෙන්ති හොන්ඩර 25 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

අලවන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.

දුම්කොල සකස්කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

සත්වාහාර ගබඩාවක් පවත්වාගෙන යාම.

පුන්නක්කු ටොන් 1ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

සත්වාහාර හෝ කුකුල් කෑම නිෂ්පාදනය කිරීම.

සතුන්ගේ මාංසාව ශේප හෝ ලේ සැපයීම.

සබ් හෝ ටැපියෝක්කා කැට (ටැපියෝකා) නිපදවීම.

ඇටකටු ගබඩා කිරීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් හෝ පවත්වාගෙන යාම.

ට්‍රන්ක් පෙට්ටි සෑදීම.

අලුත් ලෝහ හෝ පරණ ලෝහ ගබඩා කර තබා ගැනීම.

ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම.

ගෘහභාණ්ඩ නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.

මෙරට හෝ රට පෙට්ටැලින් භාණ්ඩ සෑදීම හෝ එයින් කළ භාණ්ඩ ගබඩා කර තබා ගැනීම.

වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.

කොන්ක්‍රීට් හෝ ටැට් පයිප්ප ගබඩා කර තබා ගැනීම.

සිරප් හෝ පළතුරු බීම වර්ග සෑදීම.

රසකැවිලි වර්ග නිපදවීම.

පොල්ලෙලි හෝ දුම් පල් කිරීම සඳහා කොටුවක් පවත්වාගෙන යාම.

වෙද නිපදවීම හෝ නිස්සාරණය කිරීම.

දත් බුරුසු හැර වෙනත් බුරුසු වර්ග නිපදවීම.

දත් බුරුසු නිපදවීම.

රා එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම.

විනාකිරි නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.

ඇසිඩ වර්ග නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.

හුණු ගල් හෝ හුණු ගබඩා කර තබා ගැනීම.

පැණි නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.

පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටැම්පර් සායම නිපදවීම හෝ ඒවා හොන්ඩර 5 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

ලෑලි සකස් කිරීම හෝ ලෑලි පදම් කිරීම.

කෝඩා නිපදවීම.

රෙදි සායම් කිරීම.

කොකෝවා හෝ වියලි පැපොල් කිරි ගබඩා කර තබා ගැනීම.

සටහාණ්ඩ නිෂ්පාදනය සඳහා කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.

පළතුරු, මාළු හෝ වෙනත් කෑම වර්ග ටින්වල ඇසිරීම.

කෝපි, ධාන්‍ය වර්ග, මාෂ බෝග, කුළු බඩු හෝ පිටි ඇඹරීම.

යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය හෝ මාෂ බෝග කෙටීම.

බේකිං පවුඩර් නිපදවීම.

මාජරින් නිපදවීම.

ගෑස් මැන්ටල් නිපදවීම.

පොට් නිපදවීම.

ඉටි පන්දම් නිපදවීම.

කපුරු නිපදවීම.

ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම.

රෙදි සෝදන නිල් නිපදවීම.

සායම් කුඩු නිපදවීම.

ලාකඩ නිපදවීම.

සුවඳ පුයර නිපදවීම.

පාසැල් රටහුණු නිපදවීම.

ටයර් කට්ටා කැපීම හෝ පිරවීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.

සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම.

වැලි කඩදාසි නිපදවීම.

ගල් නිපදවීම, ඇඹරීම හෝ ඔප දැමීම.

පාසැල් ගල්ලෑලි නිපදවීම.

සෞඛ්‍ය තුවා කඩ නිපදවීම.

ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම.

සෙල්ලම් බඩු නිපදවීම.

මුහුදු පාසි සකස් කිරීම හා ගබඩා කර තබා ගැනීම.

ශීත කළ මස් හෝ මාළු ගබඩා කර තබා ගැනීම.

කපාපු පොල් නිපදවීම.

ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම.

මැණික් ගල් කැපීම හෝ ඔප දැමීම.

දිය හුණු සුදු (වයිටිං) හුණු හෝ හිරිගල් නිපදවීම.

එන්සාල් (කරදමුංගු) සකස් කිරීම හෝ වෙළීම.

## III වැනි කොටස

### අන්තරායක හා අප්‍රසන්න ව්‍යාපාර

කලාතු මිනිරන් ශුද්ධ කිරීම.

රසායන ද්‍රව්‍ය පාවිච්චි කොට කුරුඳු (කරදමුංගු) එන්සාල් හෝ කෙදි වර්ග සකස් කිරීම.

ඩ්‍රයි ක්ලීනිං කරන හෝ සායම් දමන ස්ථානයක් පවත්වාගෙන යාම.

රෙදි මුද්‍රණය කරන හෝ සායම් දමන ආයතනයක් පවත්වාගෙන යාම.

විද්‍යුත් ලෝහාලේපනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම.

තෙල් හෝ සත්ව මෙද පැසවීම.

හුණු පිළිස්සීම, සකස් කිරීම, ගබඩා කිරීම හෝ හුණු ගල් කැඩීම.

මැටි බඳුන් ඔප දැමීම

ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.

මෝර වරල් සකස්කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

හොන්ඩර 3ට වැඩි ප්‍රමාණයක් තේ ගබඩා කර තබා ගැනීම.

බැටරි චාජ් කිරීම හෝ අළුත් වැඩියා කිරීම.

වෑල්ඩිං සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.

මෝටර් වාහන සර්විස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම සඳහා වැඩපලක් පවත්වාගෙන යාම.

බෝට්ටු තැනීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.

යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම.

වාත්තු මඩුවක් පවත්වාගෙන යාම.

බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම.

ගල් ස්මාරක නිපදවීම.

පැට්රෝල්, ඩීසල් තෙල් හෝ වෙනත් යම ඛනිජ තෙල් වර්ගයක් ගබඩා කොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම.

පැට්රෝල් නිකුත් කරන ස්ථානයක් පවත්වාගෙන යාම.

මෝටර් වාහන සඳහා බොඩි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.

පොලිෂ් හෝ ඉටි වර්ග නිපදවීම.

කෘෂි රසායන ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.

විෂ බීජ නාශක ද්‍රව්‍ය නිපදවීම.

මදුරු කවා (කොයිල්ස්) නිපදවීම.

ලී දඬු ආරක්ෂක ද්‍රව්‍ය නිපදවීම.

රබර් ද්‍රාවක හෝ සිමෙන්ති නිපදවීම.

ගල්තාර හෝ වෙනත් බිටුමත්මය නිෂ්පාදනය කිරීම.

වීදුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීම.

වීදුරු කැඩපත් නිපදවීම.

යකඩ තහඩු ගැල්වනයිස් කිරීම.

පාසන රියම් නිපදවීම.

ඇලුමිනියම් භාණ්ඩ නිපදවීම.

කටු කම්බි නිපදවීම.

කම්බි ඇණ නිපදවීම.

කාබන් කඩදාසි හෝ යතුරු ලියන පටි (රිබන්) නිපදවීම.

බෙලෙක් බඳුන්, වානේ පීප්ප හෝ ගබඩා ටැන්කි නිපදවීම

ජී. අයි. බාල්දි නිපදවීම.

වායු සමන යන්ත්‍ර, ශීත කරණ හෝ අධි ශීත කරණ (ඩීප් ෆ්‍රීසර්) නිපදවීම සර්විස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම.

බ්‍රේක් ලයිනිං හෝ ක්ලච් ලයිනිං නිපදවීම.

යන්ත්‍රෝපකරණ නිපදවීම.

විදුලි භාණ්ඩ නිපදවීම.

රබර් කෙවුනු කෙඳි වර්ග නිපදවීම.

සංචායක බැටරි නිපදවීම.

වියලි කෝෂ බැටරි නිපදවීම.

රියම් බැටරි නැවත චාජ් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.

රන්කම් සුන්බුන්වලින් වටිනා ලෝහ නිෂ්කර්ෂණය සඳහා ස්ථානය පවත්වාගෙන යාම.

ට්‍රැක්ටර් රථ එකලස් කිරීම.

රේඩියේටර් නිපදවීම.

විදුලි කර්මාන්ත වැඩපලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අලුත්වැඩියා කරන හෝ ගුවන්විදුලි යන්ත්‍ර නිපදවන වැඩපලක් පවත්වාගෙන යාම.

12–372—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

**කුරුවිටි කෝරළේ මැද පත්තු ගම් සභාව—රත්නපුර දිස්ත්‍රික්කය**

හැඳින්වීම.—මෙම අතුරු ව්‍යවස්ථා කුරුවිටි කෝරළේ මැද පත්තු ගම් සභාවේ කිරිඇල්ල මහජන පුස්තකාලය සඳහා වූ අතුරු ව්‍යවස්ථා නම් වේ.

1. කුරුවිටි කෝරළේ මැදපත්තු ගම් සභාව විසින් පාලනය කරනු ලබන කිරිඇල්ල මහජන පුස්තකාලය පහත සඳහන් අංගයන්ගෙන් සමන්විත වේ:—

(අ) මහජන පුස්තකාලය

(ආ) කියවීම් ශාලාව හා ළමා අංශය.

2. (1) මෙම පුස්තකාලය හා කියවීම් ශාලාව පිළිබඳ සම්පූර්ණ වගකීම හා පාලනය කුරුවිටි කෝරළේ මැදපත්තු ගම් සභාවේ සභාපති තුමා සතුවේ. පුස්තකාලය හා කියවීම් ශාලාව නිසියාකාරව පාලනය කිරීම සම්බන්ධයෙන් ඔහුට උපදෙස් ලබා ගැනීම සඳහා සුදුසු උපදේශක මණ්ඩලයක් පත් කරගත හැකිය.

(2) පුස්තකාලය හා කියවීම් ශාලාව නිසියාකාරව පැවැත්වීම හා පාලනය කිරීම ආදි කටයුතු සම්බන්ධයෙන් සම්පූර්ණ වගකීම පුස්තකාලයාධිපති වෙත පැවරේ.

3. පුස්තකාල සේවයේ ඕනෑම අංශයක් ඕනෑම කෙනෙකුට හෝ අනුමත කරන ලද ප්‍රජාමණ්ඩලයකට හෝ පාවිච්චි කිරීමට අවසර දීම හෝ නොදීම හෝ ගම් සභාවේ සභාපති තුමා සතු බලයකි. තවද, පාලන ව්‍යවස්ථාවන් උල්ලංඝනය කරන ඕනෑම කෙනෙකුට හෝ ප්‍රජා මණ්ඩලයකට මෙම අවසරය නොදී සිටීමට ගම් සභාවේ ප්‍රධානතුමාට බලය තිබේ.

4. (1) මහජන පුස්තකාලයේ සාමාජිකයෙක් වීමට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුය :—

(අ) වයස අවුරුදු 12 කට නොඅඩු අයෙකු වීම,

(ආ) සාමාන්‍යයෙන් ලියන්නට කියන්නට දනගත් අයෙකුවීට,

(ඇ) ගම් සභා ප්‍රදේශයේ ස්ථිර පදිංචිව සිටීම හෝ එම ප්‍රදේශය තුළ රක්ෂාවක යෙදී සිටින කෙනෙකු වීම,

(ඈ) පුස්තකාලයාධිපති වෙත රු. 5 ක ඇප මුදලක් තැන්පත් කර තිබීම.

(2) සාමාජිකත්වය ලබා ගැනීමට කැමති අයවළුන් පුස්තකාලයාධිපති ගෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර සම්පූර්ණ කර ඒවා පහත සඳහන් අයකු ලවා සහතික කරවා පුස්තකාලයාධිපති වෙත ඉදිරිපත් කළ යුතුයි :—

(අ) ජාතික රාජ්‍යසභා නියෝජිතයෙකු,

(ආ) සමාදාන විනිශ්චයකාරවරයෙකු,

(ඇ) ගම් සභා ප්‍රදේශය තුළ සභා නියෝජිතයෙකු,

(ඈ) පැවිදිවරයෙකු හෝ පූජකයෙකු,

(ඉ) පුස්තකාල උපදේශක කමිටුවේ සාමාජිකයෙකු,

(ඊ) පිළිගත් වෛද්‍යවරයෙකු හෝ නීතිඥයෙකු,

(උ) රු. 100 කට නොඅඩු මූලික මාසික වැටුපක් ලබන ගම්සභා කොට්ඨාශයේ පදිංචි පළාත් පාලන සේවයේ නිලධාරියෙකු,

(ඌ) රජයේ ලියාපදිංචි කරන ලද පාසැලක ප්‍රධානාචාර්‍ය වරයෙකු හෝ විදුහල්පතිවරයෙකු.

(3) 4 (2) ව්‍යවස්ථා අනුව අයදුම්පතක් සහතික කිරීමට ඇති සුදුසුකම් ඇති අයෙකුට තමාගේ අයදුම් පත්‍රය සම්බන්ධයෙන් එවැනි සහතිකයක් අත්සන්කළ නොහැක.

(4) පුස්තකාලයේ සාමාජිකත්වය ලැබීම සඳහා ප්‍රජාමණ්ඩලවලට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුයි :—

(අ) සාමාජිකත්වය අපේක්ෂා කරනු ලබන ප්‍රජාමණ්ඩලය ගම් සභාව විසින් ලියාපදිංචිය සඳහා අනුමත කර තිබීම,

(ආ) සාමාජිකයන් 20 ට වඩා වැඩි ගණනක් සිටින ප්‍රජාමණ්ඩලයක් වීම,

(ඇ) ගම්සභා බල ප්‍රදේශය තුළ පිහිටි ප්‍රජාමණ්ඩලයක් වීම,

(ඈ) පුස්තකාලයාධිපති වෙත රු. 25 ක ඇප මුදලක් තැන්පත් කර තිබීම,

(ඉ) පුස්තකාලයේ සාමාජිකත්වය ලබා ගත යුතුය යනුවෙන් ප්‍රජාමණ්ඩලය මහා සභා රැස්වීමකදී යෝජනා සම්මත කර ගෙන තිබීම,

(ඊ) පුස්තකාලයෙන් භාරගනු ලබන පොත්වල වටිනාකම හා වගකීම ප්‍රජාමණ්ඩලයේ සභාපති, ලේකම් , භාණ්ඩාගාරික යන නිලධාරි මහතුන් තිදෙනා විසින් දැරිය යුතු බවට ප්‍රජාමණ්ඩලයේ මහා සභා රැස්වීමක දී සම්මත කර ගෙන තිබීම.

(5) සාමාජිකත්වය ලබා ගැනීමට කැමති ප්‍රජාමණ්ඩලය පුස්තකාලයාධි පති ගෙන් ලබා ගත හැකි විශේෂ ආකෘති පත්‍ර සම්පූර්ණ කර ඒවා 4 (2) වැනි ව්‍යවස්ථාවේ විස්තර කර ඇති අයවළුන් අතුරෙන් දෙදෙනෙකු ලවා සහතික කරවා පුස්තකාලයාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

5. පුස්තකාලයේ සාමාජිකත්වය ලැබූ සෑම අයෙකුටම සාමාජික පත්‍රයක් බැගින් දෙනු ලැබේ. මෙම සාමාජික පත්‍රයට වරකට පොත් දෙක බැගින් ලබා ගත හැකිය.

(1) පුස්තකාලයේ සාමාජිකත්වය ලැබූ සෑම ප්‍රජා මණ්ඩලයකටම සාමාජික පත්‍රයක් බැගින් නිකුත් කරනු ලැබේ. එම සාමාජික පත්‍රයට වරකට පොත් 10 බැගින් ලබා ගත හැකිය. මෙම පොත් භාර ගැනීමේදී ඉතා අඩු වශයෙන් එම ප්‍රජා මණ්ඩලයේ සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන තිදෙනාගෙන් දෙදෙනෙකුවත් ඒ අවස්ථාවේදී පොත් බෙදාදීමේ පත්‍රිකාවේ අත්සන් කළ යුතුය.

6. පොත් ගෙන යනු ලබන සෑම සාමාජිකයෙකුට එසේ ගෙන යනු ලබන පොත් නැවත පුස්තකාලයට භාරදෙන තුරු සම්පූර්ණයෙන්ම එම පොත් සඳහා වගකිව යුතුය.

7. 5 වැනි රීතිය යටතේ සාමාජිකයෙකු විසින් තමන් ලබා ගන්නා ලද සාමාජික පත්‍රයක් නැති වුවහොත් වහාම ඒ බව පුස්තකාලයාධිපති වෙත දැන්විය යුතුය. එම සාමාජික පත්‍රය මත පුස්තකාලයෙන් පොතක් ලබා ගෙන නොමැති බැව් පුස්තකාලයාධිපතිට හොඳාකාර ඒත්තු ගියහොත් ඔහු විසින් එම සාමාජිකයාට සාමාජික පත්‍රයේ අනුපිටපතක් නිකුත් කරනු ඇත. සාමාජික පත්‍රයක් නැතිවූ බවට දැනුම් දී දින 30 ක් ගතවන තුරු නැති වූ සාමාජික පත්‍රය වෙනුවට අනු පිටපතක් පුස්තකාලයාධිපති විසින් නිකුත් කරනු නොලැබේ.

8. පුස්තකාලයෙන් ලබා ගන්නා ලද සෑම පොතක් ම එය ලබා ගත් දින සිට දින 14 ක් ඇතුළත දී පුස්තකාලයාධිපතිට ආපසු භාර දිය යුතුය. වෙනත් යම් සාමාජිකයෙකුට එම පොත අවශ්‍ය නොවුවහොත් තවත් දින 14 ක් එය ඔහු වෙතම තබා ගැනීමට පුස්තකාලයාධිපතිගෙන් අවසරය ලබා ගත හැකිය.

9. 8 වන රීතියේ ප්‍රකාර දින 14 ක් ඇතුළත දී යම් සාමාජිකයෙකු විසින් තමා ගන්නා ලද පොත් ආපසු භාර නොදුන්නොත් 15 වැනි දින සිට ඉන් ඉදිරියට ප්‍රමාද කරන සෑම දිනකටම පොතකට ශත 10 බැගින් වූ දඩ මුදලක් නියම කරනවා ඇත.

10. යම් සාමාජිකයෙකු ලබාගත් පොතක් 8 වැනි රීතියේ ප්‍රකාර දින 14 ක් ගතවීමෙන් පසු ඉදිරියට දින 30 ක් ඇතුළත දී ආපසු භාර නොදුනහොත් එය නැතිවූවාක් මෙන් සලකනු ලැබේ.

11. සාමාජිකයෙකු විසින් ගෙන යන ලද පොත් නැතිවුවහොත් හෝ 10 වන රීතියේ ප්‍රකාර නැතිවූවාක් සේ සලකනු ලැබුවහොත් එම පොත්වල සම්පූර්ණ වටිනාකම එම සාමාජිකයා විසින් ගෙවිය යුතුය. අවශ්‍ය වුවහොත් එම සාමාජිකයාගේ මුළු තැන්පත් මුදලම හෝ ඉන් කොටසක් හෝ එසේ නැති වූ පොත්වල වටිනාකම වශයෙන් පුස්තකාලය සන්තක කරනු ලැබේ. එසේ තැන්පත් කර ඇති මුදල් නැතිවූ පොත්වල වටිනාකම සඳහා නොසෑහෙන්නේ නම්, 4(2) රීතිය යටතේ සාමාජික පත්‍රය සම්පූර්ණ කර ඇති අයගෙන් හිඟ මුදල් හෝ සම්පූර්ණ මුදලම අයකර ගැනීමට සභාපති විසින් ක්‍රියා කරනු ඇත.

12. පුස්තකාලයෙන් ලබා ගත් කිසිම පොතක් කිළුටු කිරීම, ඉරි ඇඳීම හෝ පිටු ඉරා දැමීම ආදිය කිසිම හානියක් නොකිරීමට විශේෂයෙන් ම වග බලාගත යුතුය.

13. පුස්තකාලයෙන් කිසිම පොතක් භාරගන්නා අවස්ථාවේදී එයට කිසිම හානියක් සිදුවී තිබුණහොත් ඒ බව පුස්තකාලයාධිපතිට ඒ අවස්ථාවේ දීම දැනුම්දීම සාමාජිකයාගේ යුතුකමයි. කිසියම් සාමාජිකයෙකු විසින් භාර ගන්නා ලද පොතක පළුදු වීමක් හෝ හානියක් සිදුවී ඇති බව එම පොත භාරගන්නා අවස්ථාවේදී පුස්තකාලයාධිපතිට නොපෙන්වුවහොත් එම පළුදුවීම් ආදියෙන් තොරව තිබූ පොතක් ලෙස සලකනු ලැබේ.

14. සාමාජිකයකු විසින් ආපසු භාරදෙන ලද පොතක් පාවිච්චි කිරීමට නුසුදුසු අන්දමට හානි පමුණුවා ඇති බවට පුස්තකාලයාධිපතිට වැටහී ගිය හොත් එම පොතේ සම්පූර්ණ වටිනාකම එම සාමාජිකයාගෙන් අයකර ගැනීමට පුස්තකාලයාධිපතිට බලය තිබේ. අළුත් පොතක මිළ අයකරගත් පසු හානි සිදුවී ඇති පොතෙහි "මහජන පුස්තකාලය, කුරුවිටි කෝරළේ මැද පත්තු ගම් සභාව, පළුදු වීම නිසා විකුණන ලදී" යන සටහන යොද එය සාමාජිකයාට ආපසු භාර දෙනු ලැබේ.

15. (1) සාමාජිකයෙකු විසින් ගෙනයන ලද කිසිම පොතක් වෙන කිසි වෙකුට නොදිය යුතුයි.

(2) 15(1) වැනි රීතිය උල්ලංඝනය කරනු ලබන යම් සාමාජිකයකු වෙතොත් ඔහුගේ තැන්පත් මුදල පුස්තකාලය සන්තක කොට ඔහුගේ සාමාජිකත්වය ද අවලංගු කිරීමේ බලය පුස්තකාලයාධිපති හා සභාපති වෙත ඇත.

(3) සාමාජික ප්‍රජාමණ්ඩලයක් විසින් පුස්තකාලයෙන් ලබා ගන්නා ලද පොතක් හෝ පොත් එකී ප්‍රජාමණ්ඩලයේ ලියාපදිංචි සාමාජිකයින්හට හැර වෙනත් කිසිවකුට නොදිය යුතුයි.

(4) 15 (3) රීතිය උල්ලංඝනය කළ යම් ප්‍රජාමණ්ඩලයක් වෙතොත් එකී ප්‍රජාමණ්ඩලයේ ලියාපදිංචිය අවලංගු කොට තැන්පත් කර ඇති ඇප මුදල පුස්තකාලය සන්තක කිරීමේ බලය පුස්තකාලයාධිපති හා සභාවේ සභාපති තුමා වෙත ඇත.

16. බෝවෙන රෝගයකින් පෙළෙන අවධියෙක පුස්තකාලයෙන් පොත් ලබා නොගත යුතුයි. එසේ යමකු විසින් නොදැනුවත්වම හෝ පොත් පාවිච්චි කර තිබේ නම් ඒ බව පුස්තකාලයාධිපති වෙත වහාම දැන්විය යුතුයි. එවිට එවැනි පොතක් විනාශ කර දැමීමට තීරණය කරනු ලැබුව හොත් ඒ පොත වෙනුවට පොතක් ලබා දීම හෝ පොතේ වටිනාකම ගෙවීම හෝ කළ යුතුයි.

17. යම් කිසිපොතක් පළමුවෙන් ලබා ගැනීම පිළිබඳ සාමාජිකයින් අතර මතභේදයක් ඇතිවුවහොත් එය නිරාකරණය කිරීම පුස්තකාලයාධිපතිට අයත් කාර්යයකි.

18. යම් සාමාජිකයකුට විශේෂ පොතක් වෙන්කරවා ගැනීමට අවශ්‍ය වුවහොත් එම පොත පිළිබඳ විස්තර සමඟ පොතකට ශත 25 බැගින් වූ වෙන් කරවා ගැනීමේ ගාස්තුවක් පුස්තකාලයාධිපතිට භාර දිය යුතුයි. එවිට එම පොත හැකි කඩිනමින් වෙන් කොට ඉල්ලුම් කරුට ඒ බව දැනුම් දෙනවා ඇත. පොත වෙන් කර තබා ඇති බව දැනුම් දී දින 5 ක් ඇතුළත දී ඉල්ලුම් කරු විසින් එම පොත භාර ගත යුතුය. එම කාල සීමාව තුළ දී වෙන් කරවා ගත් පොත භාර නොගතහොත් තව දුරටත් ඒවා වෙන් කර තැබීමට පුස්තකාලයාධිපති බැඳී නැත.

19. යම් සාමාජිකයකු ප්‍රදේශය තුළ පදිංචිය නැතිව ගියහොත් නැතහොත් එම ප්‍රදේශයේ රැකී රක්ෂා ආදියෙන් වෙන්ව ගියහොත් ඔහුගේ සාමාජිකත්වය අවලංගු වනු ඇත. එවිට 5 වන රීතිය යටතේ ඔහු වෙත නිකුත් කර ඇති සාමාජික පත්‍රය පුස්තකාලයාධිපතිට භාර දිය යුතුයි.

20. (1) යම් සාමාජිකයකු ඉල්ලා අස්වූ විට නැති නම් 19 රීතිය යටතේ සාමාජිකත්වය අවලංගු වූ විට ඔහුගෙන් පුස්තකාලයට ලැබෙන්නට තිබෙන මුදලක් වේ නම් එය ඔහු විසින් 4 (1) (ඇ) දරණ රීතිය යටතේ තැන්පත් කර ඇති මුදලින් අඩුකර ඉතිරි මුදල ඔහුට ගෙවනවා ඇත.

(2) යම් සාමාජික ප්‍රජාමණ්ඩලයක් සාමාජිකත්වයෙන් ඉල්ලා අස් වූ විට හෝ නැත්නම 19 වැනි රීතිය යටතේ සාමාජිකත්වය අවලංගු වූ විට එම ප්‍රජාමණ්ඩලයෙන් පුස්තකාලයට ලැබෙන්නට තිබෙන යම් මුදලක් වේ නම් එය එකී ප්‍රජාමණ්ඩලය විසින් 4 (4) (ඇ) දරණ රීතිය යටතේ තැන්පත් කරන ලද මුදලින් අඩු කර ඉතිරි මුදල් ප්‍රජාමණ්ඩලය වෙත ආපසු ගෙවනු ඇත.

21. (1) සෙනසුරාද දිනවල සවස් වරුවද, ඉරිද සම්පූර්ණ දිනයද, රජයේ නිවාඩු දිනයන්හි හා සභාපති තුමා විසින් නියම කරනු ලබන දිනයන්හිද හැර අනිකුත් සෑම දිනයන්හිදීම පෙරවරු 8 සිට පස්වරු 5 දක්වා පුස්තකාලය විවෘතව තිබේ.

(2) පුස්තකාලය පාවිච්චි කරන්නන්ගේ පහසුව සඳහා 21 (1) වැනි ව්‍යවස්ථාවේ සඳහන් වේලාවන් වෙනස් කිරීම සභාවේ සභාපති තුමාට කළ හැකිය. එමෙන් ම පුස්තකාලය වසා තබනු ලබන දිනයන් ද සාමාජිකයන්ගේ පහසුව උදෙසා වෙනස් කිරීමට ද සභාපති තුමාට බලය ඇත. එසේ කළ යුත්තේ ඒ බව සාමාජිකයනට දින 7 කට පෙර දැනුම් දීමෙන් පසුවය.

22. වැසි දින වලදී වැස්සෙන් පොත් ආරක්ෂා කර ගෙන එමට හා ගෙන යෑමට සාමාජිකයන් විශේෂයෙන් ම බැඳී සිටී.

### කියවීම් ශාලාව

23. කියවීම් ශාලාව පාවිච්චි කරන සෑම කෙනෙක්ම—

(i) ඒ සඳහා පුස්තකාලයාධිපතිගෙන් නිසි පරිදි අවසරය ලබා ගත යුතුය.

(ii) කියවීම් ශාලාවේ තබා ඇති නාම ලේඛනයේ තමාගේ නම අත්සන් කළ යුතුය.

24. පහත සඳහන් සුදුසුකම් ඇති කෙනෙකුට කියවීම් ශාලාව පාවිච්චි කිරීමට අවසරය දීමට පුස්තකාලයාධිපතිට පුළුවන.

(i) සාමාන්‍ය ලිවීමට හා කියවීමට දැන සිටීම.

(ii) ගම් සභා ප්‍රදේශය තුළ පදිංචිව සිටීම හෝ එම ප්‍රදේශය තුළ රැකී රක්ෂාවක යෙදී සිටීම.

(1) සෙනසුරාදා දිනවල සවස් වරුවද, ඉරිදා සම්පූර්ණ දිනය ද, රජයේ නිවාඩු දිනයන්හි හා සභාපතිතුමා විසින් නියම කරනු ලබන දිනයන්හිද හැර අනිකුත් සෑම දිනයන්හිදීම පෙරවරු 8 සිට පස්වරු 5 දක්වා කියවීම් ශාලාව විවෘතව තිබේ.

(2) එහෙත් කියවීම් ශාලාව වසා තැබීම හෝ විවෘතව තැබීම සම්බන්ධයෙන් ගම් සභාවේ සභාපති තුමාට මෙහි පහත සඳහන් බලතල තිබේ :—

(i) කියවීම් ශාලාව පාවිච්චි කරන්නන්ගේ පහසුව සඳහා ඉතා අඩු වශයෙන් දින 7 කට පළමු කරන ලද දැනුම් දීමකින් පසු 24 (1) ව්‍යවස්ථාවේ සඳහන් වේලාවන් වෙනස් කිරීම,

(ii) ගම් සභාවේ සභාපතිතුමාට අවශ්‍ය යයි හැඟී යන පරිදි විශේෂ හේතූන් නිසා කියවීම් ශාලාව වෙනත් දිනයන්හි දී හා වේලාවන්හි දී විවෘත කරවා තැබීම,

(iii) ඉතා අඩු වශයෙන් දින 6 කට පළමු කරන ලද දැනුම් දීමකින් පසු කියවීම් ශාලාවට අයත් බඩු බාහිරාදිය ගණන් ගැනීම සඳහා නියම කරන ලද දිනයන්හිදී කියවීම් ශාලාව වසා තැබීම.

25. කියවීම් ශාලාවට අයත් කිසිම පොතක්, සඟරාවක්, සිතියමක් ලියවිල්ලක් හෝ වෙනත් කිසිම දේපලක් කියවීම් ශාලාවෙන් පිටතට කිසිවකු විසින් ගෙනා නොහැකිය.

### සාමාන්‍ය

26. බෝවන රෝගයකින් පෙළෙන කිසිම කෙනෙකුට රෝග පැතිර යාමේ කාලසීමාව ඉක්මවා යනතුරු මහජන පුස්තකාලයට හෝ කියවීම් ශාලාවට ඇතුළු විය නොහැකිය.

27. කියවීම් ශාලාව තුළ හෝ පුස්තකාලය තුළ හෝ ඒ අසල නොමනා අන්දමින් හෝ අනුන්ට හිරිහැර වන අන්දමින් හෝ නොහැසිරිය යුතුය.

(1) පුස්තකාලය හා කියවීම් ශාලාව තුළ හෝ ඒ අවට ඇති ගම් සභාව සතු ගොඩනැගිලි වලට හෝ වෙනත් දේපල වලට කිසිම අලාභ හානියක් නොකළ යුතුය.

(2) කියවීම් ශාලාව හා පුස්තකාලය වසා ඇති වේලාවන්හිදී නිකරුණේ ඒ අසල නොහැසිරිය යුතුය.

(3) කියවීම් ශාලාව හා පුස්තකාලය තුළ දුම් බීම හා කෙලගැසීම තහනම්ය

(4) මහජන පුස්තකාලය තුළ දී හෝ ඒ අසල දී කිසිවකු විසින් දාදුවලින් හෝ කඩදාසිවලින් සූදු කෙළීම හෝ මුදල් ඔට්ටු කිරීමෙන් කිසිම ක්‍රියාවක් හෝ නොකළ යුතුය.

(5) පුස්තකාලය හා කියවීම් ශාලාව තුළ හෝ ඒ අවට කෑගැසීම හෝ සිංදු කීම හෝ වෙනත් ශබ්ද ආදිය කිරීමෙන් පුස්තකාලය හා කියවීම් ශාලාව පාවිච්චි කරන්නන්ට බාධා නොකළ යුතුය.

(6) අපිරිසිදු ලෙස කියවීම් ශාලාවට හෝ පුස්තකාලයට ඇතුළු නොවිය යුතුය.

(7) බල්ලන්, බළලුන් හෝ වෙනත් සතුන් පුස්තකාලය හා කියවීම් ශාලා භූමියට නොගෙන ආ යුතුය.

(8) මහජන පුස්තකාලය හෝ කියවීම් ශාලාව හෝ ඒ අසල නිදා ගැනීම හෝ ආහාර ගැනීම හෝ නොකළ යුතුය.

(9) පුස්තකාලයාධිපති විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද අයෙකු විසින් මේ අතුරු ව්‍යවස්ථාව යටතේ නීත්‍යානුකූලව කරනු ලබන කටයුතු වලට කිසිවෙක් බාධා නොකළ යුතුය.

28. මෙම අතුරු ව්‍යවස්ථාවල ප්‍රධානතුමා හෝ සභාපති තුමා යනුවෙන් එවකට කුරුවිටි කෝරළේ මැද පත්තු ගම් සභාවේ සභාපති තුමා හෝ පාලන නිලධාරි තුමා ද, පුස්තකාලයාධිපති වශයෙන් කුරුවිටි කෝරළේ මැද පත්තු ගම් සභාව විසින් පත්කර ඇති පුස්තකාලයාධිපති හෝ පුස්තකාල සහායක ද, ගම්සභාව යනුවෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිටි කෝරළේ මැද පත්තු ගම් සභාව ද අදහස් කරනු ලැබේ.

බී. ජී. ගෝවින්දපාල,
පාලන නිලධාරි,
කුරුවිටි කෝරළේ මැද පත්තු ගම් සභාව.

1973 නොවැම්බර් මස 26 වැනි දින,
කිරිඇල්ලේ පිහිටි
කුරුවිටි කෝරළේ මැදපත්තු
ගම්සභා කාර්යාලයේ දීය.

12–370—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

## අටුලුගම ගම්සභාව—දෙහිඕවිට

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි නම් සඳහන් අය එහි සඳහන් ස්ථානයන්හි 1974 වර්ෂයට ගව මස් කඩ පවත්වා ගෙන යාමට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බැවින් මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන අටුලුගම ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම කෙනෙකුගෙන් විරුද්ධත්වයක් ඇත්නම්, එසේ විරුද්ධ වන්නේ අසවල් කරුණ නිසා යැයි සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව, මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත එවීමට බලය තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 272 වෙනි පරිච්ඡේදයේ 7 (2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාමේ ස්වභාවය | පිහිටි ස්ථානය |
|---|---|---|
| 4. අයි. ඇම්. පාරුක්, කරවනැල්ල, රුවන්වැල්ල ... ... | ගව මස් වෙළඳාම ... | පරණ දුම්රියපල ඉඩම, ගරාගොඩ |

1973 නොවැම්බර් මස 29 වැනි දින,
අටුලුගම ගම්සභා කාර්යාලය,
දෙහිඕවිට.

පී. වී. පොඩිනිලමේ ගරාගොඩ,
අටුලුගම ගම්සභාවේ සභාපතිතැන.

12–311—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

**1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනත (261 වැනි අධිකාරය)**

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ මාතලේ දිස්ත්‍රික්කයේ ගම්පහසිය පත්තුව ගම්සභාව විසින් සම්මත කරනු ලැබූ යෝජනාව එකී වගන්තිය යටතේ මෙහි පළ කරනු ලැබේ.

යෝජනාව

පළාත් පාලන ඇමතිතුමා විසින් සම්පාදනය කරනු ලැබූ, 1966 ජූලි මස 28 වැනි දින අංක 14,703 දරණ ගැසට් පත්‍රයේ පල කරන ලද්ද වූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1969 ජනවාරි මස 03 වැනි දින අංක 14,835 දරණ ගැසට් පත්‍රයේ පලවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්ද වූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 39, 40 සහ 41 වැනි කාණ්ඩද,

පළාත් පාලන ඇමතිතුමා විසින් සම්පාදනය කරනු ලැබ, 1972 නොවැම්බර් මස 03 වැනි දින අංක 32 දරණ ගැසට් පත්‍රයේ පල කරන ලද්දවූ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 42 වැනි කාණ්ඩයද,

මෙම නිරණය ගැසට් පත්‍රයේ පළවූ දින සිට ක්‍රියාත්මක වන අන්දමින් පිළිගැනීමට මාතලේ දිස්ත්‍රික්කයේ ගම්පහසිය පත්තුව ගම්සභාව විසින් (261 අධිකාරය වන) පළාත් පාලන ආයතන පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කරනු ලැබේ.

පේමානායක විජේතුංග,
සභාපති,
ගම්පහසිය පත්තුව ගම්සභාව.

1973, නොවැම්බර් මස 28 වැනි දින,
ගම්පහසිය පත්තුව ගම්සභා කාර්යාලය, පලාපත්වෙල.

12–300—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

**පනාවල් කෝරළේ (නැගෙනහිර සහ බටහිර) ගම්සභාව—පනාවල**

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ නම සඳහන් අය එහි සඳහන් ස්ථානයන්හි 1974 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා බලපත්‍ර ඉල්ලා අයදුම්පත් මා වෙත එවා තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ (272 වැනි අධිකාරය) 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. එකී බලපත්‍ර නිකුත් කිරීම ගැන පනාවල් කෝරළේ (නැ. සහ බ.) ගම්සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙකු විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇ විරුද්ධ වන්නේ කුමන හේතූන් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුතුව මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දන්වා සිටිමි.

කේ. එච්. ජයසිංහ,
පනාවල් කෝරළේ (නැ. සහ බ.) ගම්සභාපති.

1973 නොවැම්බර් මස 29 වැනි දින,
පනාවල, ගම්සභා කාර්යාලයේදීය.

උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|---|
| 1. | ඇම්. ඒ. ඩබ්ලිව්. ඇම්. දකරියා, පනාවල පාර, ඇහැළියගොඩ | පතිරන්නැහැලාගේ වත්ත, කැන්දන්ගමුව නගරය | එළ ගවමස් |
| 2. | ඇම්. ඒ. ඩබ්ලිව්. ඇම්. දකරියා, පනාවල පාර, ඇහැළියගොඩ | පතිරන්නැහැලාගෙ වත්ත, කැන්දන්ගමුව නගරය | එලු මස් |
| 3. | ඇම්. ඇස්. ඇම්. තමීම පනාවල පාර, ඇහැළියගොඩ | පන්දප්පිටිහේන, පරකඩුව | එළ ගවමස් |
| 4. | ඇම්. ඇස්. ඇම්. තමීම්, පනාවල පාර, ඇහැළියගොඩ | මහවත්ත, අස්ගගුල, පනාවල පාර | එළ ගවමස් |

12–296—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

**මාතලේ මැදසියපත්තුව ගම්සභාව**

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 17 (1) වගන්තිය යටතේ දැනුම් දීමයි

1973.10.30 දින පවත්වන ලද මාතලේ මැදසියපත්තුව ගම්සභාවේ මාසික සභා රැස්වීමේදී සම්මත කරණ ලද යෝජනාව අනුව, උකුවෙල ප්‍රසිද්ධ මාර්කට් ගොඩනැගිල්ලේ අංක 1 සහ 2 දරණ මස්කඩවල ගවමස් වෙළඳම් කිරීම සහ ඒ වෙනුවෙන් අනුමත ස්ථානවල ගවයින් මැරීම හැර, මෙම බලමණ්ඩලයට අයත් සීමාවන්තුල වෙනත් කිසිම ස්ථානයක කිසිම කෙනෙකුන් හෝ සමූහයක් විසින් ගවයින් මැරීම, ගවමස් වෙළඳාම කිරීම සහ වෙළඳාම සඳහා තබාගැනීම 1974.01.01 දින සිට, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 17 (1) වගන්තිය යටතේ මෙයින් තහනම් කරමි.

ඒ. බී. විජේසිංහ,
මාතලේ මැදසියපත්තුව ගම්සභාවේ සභාපති.

1973 නොවැම්බර් 28 දින,
ගම්සභා කාර්යාලය,
උකුවෙල.

12–347—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

**මහනුවර දිස්ත්‍රික්කයේ පා. හේ. හේවාහිස්ස කෝරලේ ගම්සභාව**

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම සඳහා 1974 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන ප.හේ. හේවාහිස්ස කෝරලේ ගම්සභාව සීමාවතුල පදිංචි යම් කෙනෙක් විරුද්ධවන්නේනම් එසේ විරුද්ධවීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුක්ත ලියවිල්ලක් මෙම දන්වීම ගැසැට් පත්‍රයේ පලවූ දින සිට දින 14 ක් ඇතුලතදී මාවෙත ලියා එවීමට බලය තිබෙන බවත්, (272 වැනි අධිකාරිය) මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 7 දරණ වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|---|
| 1. | ඇම්. ආර්. ඇම්. පාරුක්, නිව්ඇල්පිටිය, ගෙලිඔය, | හරක්මස් වෙළඳාම | දෙල්තොට වරිපනම් අංක 101 දරන ගම්සභා ගොඩනැගිල්ල |
| 2. | ඇම්. ඉසැඩ්. ඇම්. පාරොස්, පැනිකුඩුමුල්ල, නාවලපිටිය | හරක්මස් වෙළඳාම | දෙල්තොට වරිපනම් අංක 103 දරණ ගම්සභා ගොඩනැගිල්ල |
| 3. | ඇම්. ආර්. ඇම්. රෂීඩ්, නිව්ඇල්පිටිය, ගෙලිඔය | එළු මස් වෙළඳාම | දෙල්තොට වරිපනම් අංක 105 ගම්සභා ගොඩනැගිල්ල |
| 4. | වයි. ඇම්. ඒ. කාදර්, පල්ලේගම, දෙල්තොට | හරක්මස් වෙළඳාම | පල්ලේගම ගල්කඩුව වත්ත |
| 5. | ඒ. මොහොමඩ් මකීම්, උඩුදෙණිය, මාරස්සන | හරක්මස් වෙළඳාම | උඩුදෙනිය මඩිගේදුනුගේ වත්ත |

කේ. බී. වික්‍රමසිංහ,
හේවාහිස්ස කෝරලේ ගම්සභාවේ සභාපති.

12–325—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

### ගාලු දිස්ත්‍රික්කයේ පහලගම්හය ගම් සභාව

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත විස්තර දක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා විකිණීට සඳහා 1974 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීම ගැන පහලගම්හය ගම්සභා ප්‍රදේශය තුල පදිංචි යම කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර දෙපිටපතකින් යුතු ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට දින 14 ක් ඇතුලත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ (272 වන අධිකාරයේ) 7 (2) වන වගන්තිය ප්‍රකාර මෙයින් දනුව දෙමි.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | ගවයින් මරණ ස්ථානය | ගවමස් විකුණන ස්ථානය |
|---|---|---|
| 1. ටී. මොහොදීන්, කුන්දූව, හබුරුගල | ... කුන්දූව, ගලතොටුපලවත්ත | ... කුන්දූව, ගලතොටුපලවත්ත |
| 2. ඇස්. කේ. පිච්චෙයි, කුන්දූව, හබුරුගල | ... කුන්දූව, ගලතොටුපලවත්ත | ... කුන්දූව, ගලතොටුපලවත්ත |

ප්‍රේමරාජ කුමාරසිංහ,
පහලගම්හය ගම සභාවේ සභාපති.

1973 දෙසැම්බර් මස 01 වැනි දින,
පහලගම්හය ගම්සභා කාර්‍යාලය,
හබුරුගල.

12–350—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

### කුඹුක්වැව ගම්සභා ප්‍රදේශය—කුරුණෑගල දිස්ත්‍රික්කය

මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥාපනත

මෙහි උපලේඛනයේ නම් සඳහන් අයවලුන් විසින් එහි දක්වෙන ස්ථානවල 1974 වර්ෂය තුළ මස් කඩයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ඉල්ලුම්කර ඇති බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීම ගැන කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුඹුක්වැව ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම කෙනෙකුගේ හෝ සංවිධානයක විරුද්ධත්වයක් ඇත්නම් එය විස්තර සහිතව ලිපියකින් පිටපත් දෙකක් සිටින සේ සකස් කොට මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත එවීමට බලය ඇති බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (257 අධිකාරිය) 7 (2) වැනි වගන්තිය යටතේ දනුම් දෙමි.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | බලපත්‍රයේ ස්වභාවය | ස්ථානය |
|---|---|---|
| 1. ඇම්. හමඩිරි, අංක 8, බෝධිරාජ මාවත, කුරුණෑගල ... | ... එළ හරක් මස් ... | ... තිත්තවැල්ගාලගම |

ඇස්. ඇම්. කපුරුබණ්ඩා,
කුඹුක්වැව ගම්සභාවේ සභාපති.

1973 දෙසැම්බර් මස 01 වැනි දින,
කුඹුක්වැව ගම්සභා කාර්යාලය,
කුඹුක්ගැටේ, ඉබ්බාගමුව.

12–488—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

### 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනත (261 වැනි අධිකාරය)

ඉගිනියාගල ගම්සභාව

පළාත් පාලන ආයතන '' පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා '' පනතේ 3 වැනි වගන්තිය යටතේ මොණරාගල දිස්ත්‍රික්කයේ ඉගිනියාගල ගම්සභාවේ පාලන නිළධාරි විසින් ගෙන ඇති පහත දක්වෙන තීරණය එකී වගන්තියේ ප්‍රකාර මෙහි පළකරනු ලැබේ.

**තීරණය**

පළාත් පාලන අමාත්‍යතුමා විසින් සම්පාදනය කරනු ලැබ 1953 අප්‍රේල් මස 10 වන දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දවූ ද, උත්තර මන්ත්‍රීමණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1953 අගෝස්තු මස 7 වෙනි දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දවූ ද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 1 සිට 37 දක්වා වූ කාණ්ඩද, (අංක 1 සහ 37 වැනි කාණ්ඩ දෙකම ඇතුලත්ව)

පළාත් පාලන අමාත්‍යතුමා විසින් සම්පාදනය කරනු ලැබ 1963 ජූනි මස 21 වැනි දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දවූද, උත්තර මන්ත්‍රීමණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රීමණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1965 ජනවාරි මස 8 වන දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 38 වැනි කාණ්ඩය ද,

පළාත් පාලන අමාත්‍යතුමා විසින් සම්පාදනය කරනු ලැබ 1966 ජූලි මස 8 වැනි දින අංක 14,703 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දවූද, උත්තර මන්ත්‍රීමණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1969 ජනවාරි මස 3 වැනි දින අංක 14,835 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දවූද, පොදු අතුරු ව්‍යවස්ථාවල අංක 39 සිට 41 දක්වා වූ කාණ්ඩද, (අංක 39 සහ 41 වැනි කාණ්ඩ දෙකම ඇතුලත්ව)

1972 නොවැම්බර් මස 3 වැනි දින අංක 32 දරණ ගැසට් පත්‍රයේ පළ කරනලද්දවූ අංක 42 දරණ කොටසේ සඳහන් පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවද මෙම තීරණය ගැසට් පත්‍රයේ පළවූ දින සිට ක්‍රියාත්මක වන අන්දමින් පිළිගැනීමට මොණරාගල දිස්ත්‍රික්කයේ ඉගිනියාගල ගම්සභාවේ පාලන නිළධාරි විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි අධිකාරය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් තීරණය කරනු ලැබේ.

ආර්. රුද්‍රනාදන්,
පාලන නිළධාරි, ඉගිනියාගල ගම්සභාව.

1973 දෙසැම්බර් මස 03 වන දින,
ඉගිනියාගල ගම් සභා කාර්‍යාලයේ දිය.

12–484—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

### කුඹුක්වැව ගම්සභාව

අතුරු ව්‍යවස්ථා

මෙම අතුරු ව්‍යවස්ථා කුඹුක්වැව ගම්සභාවේ මහජන පුස්තකාල අතුරු ව්‍යවස්ථා නමින් හැඳින්වේ.

කුඹුක්වැව ගම්සභාව මගින් පාලනය කරනු ලබන පුස්තකාලය පහත සඳහන් අංශයන්ගෙන් සමන්විත වේ :—

(අ) මහජන පුස්තකාලය ;

(ආ) කියවීම ශාලාව.

2. (1) මෙම පුස්තකාලය හා කියවීම් ශාලාව පිළිබඳ සම්පූර්ණ වගකීම හා පාලනය කුඹුක්වැව ගම්සභාව සතුවේ. පුස්තකාලය හා කියවීම් ශාලාව නිසියාකාරීව පාලනය කිරීම හා පැවැත්වීම සම්බන්ධයෙන් සභාපතිතුමාට උපදෙස් ලබා ගැනීම සඳහා සුදුසු උපදෙස් මණ්ඩලයක් පත්කරගත හැකිය.

(2) පුස්තකාලය හා කියවීම් ශාලාව නිසියාකාරීව පැවැත්වීමට හා පාලනය කිරීම ආදී කටයුතු සභාපතිතුමාගේ උපදෙස් අනුව ''පුස්තකාල භාරකරු'' විසින් ඉටුකළ යුතුය.

3. පුස්තකාල සේවය ඕනෑම කෙනෙකුට හෝ අනුමත කරන ලද ප්‍රජාමණ්ඩලයකට පාවිච්චි කිරීමට අවසර දීම හෝ නොදීම සභාපතිතුමා සතු බලයකි. තවද පාලන ව්‍යවස්ථාවන් උල්ලංඝනය කරන ඕනෑම කෙනෙකුට හෝ ප්‍රජාමණ්ඩලයකට මෙම අවසරය නොදී සිටීමට සභාපතිතුමාට බලය තිබේ.

19. යම් සාමාජිකයෙකු ප්‍රදේශය තුළ පදිංචිය නැතිව ගියහොත්, එම ප්‍රදේශයෙන් රැකිරක්ෂා ආදිය සඳහා වෙන්ව ගියහොත් ඔහුගේ සාමාජිකත්වය අවලංගුවනවා ඇත. එවිට 5 වන රීතිය යටතේ ඔහු වෙත නිකුත් කරන ලද සාමාජික පත්‍රය පුස්තකාල භාරකරුට ආපසු භාරදිය යුතුය—

(i) යම් ප්‍රජාමණ්ඩලයක් ක්‍රියා විරහිත වුවහොත් එකී ප්‍රජාමණ්ඩලයේ සාමාජිකත්වය අවලංගුවනවා ඇත. එවිට 5 (i) වන රීතිය යටතේ එම ප්‍රජාමණ්ඩලයට නිකුත් කරන ලද සාමාජික පත්‍රය පුස්තකාල භාරකරුට ආපසු භාරදිය යුතුය.

20. යම් සාමාජිකයෙකු ඉල්ලා අස්වූ විට නැති නම් 19 වන රීතිය යටතේ සාමාජිකත්වය අවලංගු වූ විට පුස්තකාලයට ලැබෙන්නට තිබෙන මුදලක් වෙනම ඔහු විසින් 4 (i) (ඇ) දරණ නීතිය යටතේ තැන්පත් කරන ලද මුදලින් අඩුකර ඉතිරි මුදල් ඔහුට ගෙවනවා ඇත.

(ii) යම් සාමාජික ප්‍රජාමණ්ඩලයක් ඉල්ලා අස්වූ විට නැතිනම් 19 (i) දරණ නීතිය යටතේ සාමාජිකත්වය අවලංගු වූ විට එම ප්‍රජාමණ්ඩලයෙන් පුස්තකාලයට ලැබෙන්නට තිබෙන යම් මුදලක් වෙනම එකී ප්‍රජාමණ්ඩලය විසින් 4 (iv) (ඇ) දරණ රීතිය යටතේ තැන්පත් කරන ලද මුදලින් අඩුකරනු ලැබේ.

21. සෙනසුරාද දිනයන්, ඉරිදා දිනයන්, රජයේ නිවාඩු දිනයන් සහ සභාපතිතුමා විසින් නියම කරනු ලබන දිනයන් හැර අනෙක් දිනවල දිනපතා පෙරවරු 8.30 සිට පස්වරු 3.00 දක්වාත්, සෙනසුරාද දිනවල පෙරවරු 8.30 සිට 11.30 දක්වාත් පුස්තකාලය විවෘතව තබනු ඇත.

**කියවීම් ශාලාව**

22. කියවීම් ශාලාව පාවිච්චිකරන සෑම කෙනෙක්ම :—

(i) ඒ සඳහා පුස්තකාල භාරකරුගෙන් නිසිවූ පරිදි අවසර ලබාගත යුතුය.

(ii) කියවීම් ශාලාවේ තබා ඇති නාමලේඛණයේ තමන්ගේ නම අත්සන් කර තැබිය යුතුය.

23. පහත සඳහන් සුදුසුකම් ඇති ඕනෑම කෙනෙකුට කියවීම් ශාලාව පාවිච්චිකිරීමට අවසරදීමට පුස්තකාල භාරකරුට පුළුවන :—

(i) වයස අවුරුදු 12 කට අඩුනොවීම ;

(ii) සාමාන්‍යයෙන් කියවීම හා ලිවීම දැන සිටීම ;

(iii) ගම්සභා ප්‍රදේශය තුළ පදිංචිව සිටීම හෝ එම ප්‍රදේශය තුළ රැකී රක්ෂාවක යෙදී සිටීම.

24. (i) සෙනසුරාද දිනයන්, ඉරිදා දිනයන් සහ රජයේ නිවාඩු දිනයන් හැර අනෙක් දිනවල පෙරවරු 8.30 සිට 12.00 දක්වාද, පස්වරු 1.00 සිට 3.00 දක්වාද, සෙනසුරාද දිනයන්හිදී පෙරවරු 8.30 සිට 11.30 දක්වාද කියවීම් ශාලාව විවෘතව තබනවා ඇත.

(ii) කියවීම් ශාලාව පාවිච්චි කරන්නන්ගේ දැනගැනීම සඳහා කියවීම් ශාලාවේ අඩු වශයෙන් දින (5 කට) පහකට දැන්වීමක් මගින් ප්‍රචාරය කර 24 (i) දරණ ව්‍යවස්ථාවෙන් නියමකර ඇති කාලසීමාවන් වෙනස් කිරීමට සභාපති තුමාට බලය තිබේ.

25. කියවීම් ශාලාවට අයත් කිසියම් පොතක් පතක්, සඟරාවක්, සිතියමක්, ලියවිල්ලක් හෝ වෙනත් කිසියම් දේපලක් කිසිවෙකු කියවීම් ශාලාවෙන් ඉවතට ගෙනයායුතු නැත.

26. බෝවන රෝගයකින් පෙලෙන කිසිම කෙනෙකු රෝග පැතිරයාමේ කාලසීමාව ඉක්මවා යනතුරු ''මහජන පුස්තකාලයට හෝ කියවීම් ශාලාවට'' ඇතුළු නොවිය යුතුය.

27. කියවීම් ශාලාව හෝ පුස්තකාලය තුලදී හෝ ඒ අසළ නොමනා අන්දමින් හෝ අනුන්ට හිරිහැර වන අන්දමින් නොහැසිරිය යුතුය—

(i) පුස්තකාලය හෝ කියවීම් ශාලාව තුළ හෝ ඒ අවට ගම්සභාව සතු ගොඩනැගිල්ලට හෝ වෙනත් දේපලවලට කිසිම අලාභහානියක් නොකළ යුතුය ;

(ii) කියවීම් ශාලාව හා පුස්තකාලය වසා ඇති වේලාවන් තුළදී නිකරුණේ ඒ අසළ නොහැසිරිය යුතුය ;

(iii) කියවීම් ශාලාව හා පුස්තකාලය තුළ දුම්බීම හා කෙළ ගැසීම නොකළ යුතුය ;

(iv) මහජන පුස්තකාලය තුළදී හෝ ඒ අසළ දී කිසිවෙකු විසින් දදු වලින් හෝ කඩදාසි වලින් සූදුකෙළීම හෝ ඔට්ටු කිරීමෙන් කිසිම ක්‍රීඩාවක් කිරීම හෝ නොකළ යුතුය ;

(v) පුස්තකාලය හා කියවීම් ශාලාව ඇතුළත හෝ ඒ අසළ කෑගැසීම, සින්දු කීම හෝ වෙනත් ශබ්ද ආදිය කිරීමෙන් පුස්තකාලය හා කියවීම් ශාලාව පාවිච්චි කරන්නන්ට බාධා නොකළ යුතුය ;

(vi) අපිරිසිදු ලෙස කියවීම් ශාලාවට හෝ පුස්තකාලයට ඇතුළු නොවිය යුතුය ;

(vii) බල්ලන් හෝ බළලුන් වැනි කිසිම සතුන් පුස්තකාලයට හා කියවීම් ශාලාවට හා ගම්සභා භූමියට නොගෙනා යුතුය ;

(viii) මහජන පුස්තකාලය හා කියවීම් ශාලාව තුල හෝ ඒ අසළ නිදා ගැනීම හෝ ආහාර ගැනීම නොකළ යුතුය ;

(ix) පුස්තකාල භාරකරු හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීමට බලය පවරන ලද අයෙකු විසින් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නීත්‍යානුකූලව ඉටුකරනු ලබන කටයුතු වලට කිසිවකු විසින් බාධා නොකළ යුතුය.

28. මෙම අතුරු ව්‍යවස්ථාවල :—

''සභාපතිතුමා'' යනුවෙන් ගම්සභාවේ සභාපතිතුමාද ;

''ගම්සභාව'' යනුවෙන් කුඹුක්වැව ගම්සභාවද ;

''ගම්සභා ප්‍රදේශය'' යනුවෙන් කුඹුක්වැව ගම්සභා ප්‍රදේශයද ;

''පුස්තකාල භාරකරු'' යනුවෙන් ගම්සභාව විසින් පත්කරන ලද පුස්තකාල භාරකරුද ;

''සාමාජිකයෙකු'' යනුවෙන් 4 (i) වන ව්‍යවස්ථාව යටතේ සාමාජිකත්වය ලැබූ අයකු හෝ 4 (iv) යටතේ සාමාජිකත්වය ලැබූ ප්‍රජාමණ්ඩලයක්ද අදහස් කරනු ලැබේ.

ඇස්. ඇම්. කපුරුබන්ඩා,
කුඹුක්වැව ගම්සභාවේ සභාපති.

1973 දෙසැම්බර් මස 01 වැනි දින,
කුඹුක්වැව ගම්සභා කාර්යාලය,
කුඹුක්ගැටේ.

12–489—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

**1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පණත (261 වැනි අධිකාරය)**

නාමල්ඔය ගම්සභාව

පළාත් පාලන ආයතන '' පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා '' පනතේ 3 වැනි වගන්තිය යටතේ අම්පාර දිස්ත්‍රික්කයේ නාමල් ඔය ගම්සභාවේ පාලන නිළධාරි විසින් ගෙන ඇති පහත දැක්වෙන තීරණය එකී වගන්තියේ ප්‍රකාර මෙහි පළකරනු ලැබේ.

**තීරණය**

පළාත් පාලන අමාත්‍ය තුමා විසින් සම්පාදනය කරනු ලැබ 1953 අප්‍රේල් මස 10 වැනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1953 අගෝස්තු මස 7 වැනි දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 1 සිට 37 දක්වා වූ කාණ්ඩද, (අංක 1 සහ 37 වැනි කාණ්ඩ දෙකම ඇතුලත්ව)

පළාත් පාලන අමාත්‍ය තුමා විසින් සම්පාදනය කරනු ලැබ 1963 ජූනි මස 21 වැනි දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූද, උත්තර න්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1965 ජනවාරි මස 8 වැනි දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 38 වැනි කාණ්ඩයද,

පළාත් පාලන අමාත්‍ය තුමා විසින් සම්පාදනය කරනු ලැබ 1966 ජූලි මස 8 වැනි දින අංක 14,703 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1969 ජනවාරි මස 3 වැනි දින අංක 14,835 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල, අංක 39 සිට 41 දක්වා වූ කාණ්ඩද, (අංක 39 සහ 41 වැනි කාණ්ඩ දෙකම ඇතුලත්ව)

1972 නොවැම්බර් මස 3 වැනි දින අංක 32 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූ අංක 42 දරණ කොටසේ සඳහන් පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවද, මෙම තීරණය ගැසට් පත්‍රයේ පළවූ දින සිට ක්‍රියාත්මක වන අන්දමින් පිළිගැනීමට අම්පාර දිස්ත්‍රික්කයේ නාමල්ඔය ගම්සභාවේ පාලන නිලධාරී විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි අධිකාරය) 3 වැනි වගන්තියෙහි (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් තීරණය කරනු ලැබේ.

ආර්. රුද්‍රනාදන්,
පාලන නිළධාරි,
නාමල්ඔය ගම්සභාව.

1973 ක්වූ දෙසැම්බර් මස 04 වන දින,
නාමල්ඔය ගම්සභාවේ දී ය.

12–502—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

### 1952 අංක 3 දරණ පළාත් පාලන ආයතන පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනත (261 වැනි අධිකාරිය)

පළාත් පාලන පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනතේ 3 වෙනි වගන්තිය යටතේ මාතලේ දිස්ත්‍රික්කයේ අස්ගිරි පල්ලේසිය පත්තු ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පලකර සිටිනු ලැබේ.

යෝජනාව

" පළාත් පාලන ඇමතිතුමා විසින් සම්පාදනය කරනු ලැබ, 1953 අප්‍රේල් මස 10 වැනි දින, අංක 10,517 දරන ගැසට් පත්‍රයේ පලකරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1953 අගෝස්තු මස 7 වැනි දින අංක 10,560 දරන ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයකින් ප්‍රකාශයට පත් කරන ලද්දාවූ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 1 සිට 37 දක්වා වූ කාණ්ඩද, 1963 ජූනි මස 21 දින අංක 13,679 දරන ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයකින් ප්‍රකාශයට පත්කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරනු ලැබ, 1965 ජනවාරි මස 8 වැනි දින අංක 14,287 දරන ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පමුණුවන ලද එකී අතුරු ව්‍යවස්ථා මාලාවේ අංක 38 දරන කාණ්ඩයද, 1966 ජූලි මස 8 දින අංක 14,703 දරන ගැසට් පත්‍රයේ පලවූ නිවේදනයකින් ප්‍රකාශයට පත් කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරනු ලැබ 1969 ජනවාරි මස 3 වන දින අංක 14,835 දරන ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පමුණුවන ලද, එකී අතුරු ව්‍යවස්ථා මාලාවේ අංක 39, 40 සහ 41 වන කාණ්ඩද, 1972 නොවැම්බර් මස 3 වන දින අංක 32 දරන ශ්‍රී ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරන ලද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 42 දරන කාණ්ඩයත්, මෙම යෝජනාව ශ්‍රී ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලවූ දින සිට ක්‍රියාත්මක වන අන්දමින් සම්මත කර ගැනීමට මාතලේ දිස්ත්‍රික්කයේ අස්ගිරි පල්ලේසිය පත්තු ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වන අධිකාරය) 3 වැනි වගන්තියේ (1) වැනි උප. වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ."

පී. එච්. ආතර් අල්ලිස්,
සභාපති,
අස්ගිරි පල්ලේසිය පත්තු ගම්සභාව.

අස්ගිරි පල්ලේසියපත්තු ගම්සභා කාර්යාලය,
යටවත්ත,
1973 නොවැම්බර් 30 වැනි දින.

12-494—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

### කෑගල්ල නගරය

නගර සභා ආඥපනත

(255 වන අධිකාරය වන) නගර සභා ආඥපනතේ 184 වැනි වගන්තිය හා එක්ව කියවිය යුතු එම ආඥපනතේ 130 (ආ) සහ 153 වන වගන්ති යටතේ කෑගල්ල නගරයේ විශේෂ කොමසාරිස් විසින් සම්පාදනය කරන ලදුව, ඒ ආඥපනතේ 154 වන වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාවයි.

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973 දෙසැම්බර් මස 3 වැනි දින.

අතුරු ව්‍යවස්ථාව

(255 වන අධිකාරය වන) නගර සභා ආඥපනතේ 130 (ආ) වන වගන්තිය යටතේ 1973 වර්ෂය වෙනුවෙන් පනවන ලද, 1973 පෙබරවාරි මස 09 වැනි දින සහ අංක 46 දරණ ගැසට් පත්‍රයෙහි පල කරණ ලද 1973 ජනවාරි මස 24 වන දින දරණ නිවේදනයෙහි සඳහන් විශේෂ ජල බද්දෙන්, මෙහි පහත සඳහන් උපලේඛනයෙහි දක්වෙන වරිපනම් අංක දරණ ස්ථාන නිදහස් විය යුතුය.

උපලේඛනය

කොට්ඨාශ අංක 1

කදුරුපොකුන පාර.—49, 65/6, 85 සහ 85/8.

මාතර පාර.—349, 371/1, 387, 407, 222, 222/1, 260, 262, 296, 336, 354, 354/10, 354/12.

මුවර් පාර.—57/5 ඒ, 57/6.

බන්ධනාගාර පාර.—6.

පල්ලිකුඩාව පාර.—19/6, 33ඒ, 39/7.

කොට්ඨාශ අංක 2

මාතර පාර.—3/1, 201/5, 225, 233, 255, 263, 267.

මාර්කට් පාර.—51, 57/6, 145, 151, 160.

මරේ පාර.—51.

පරාක්‍රම පාර.—29, 31, 45/1, 71/1, 52.

තේක්කවත්ත උඩ පාර.—26, 40/1.

කොට්ඨාශ අංක 3

ඇන්නපිටිය පාර.—7, 11/22, 11/25, 11/30, 33, 32/11, 36, 44, 44/3, 54, 66/1.

බෙලිඅත්ත පාර.—75බී, 75/5, 75/7ඊ, 91, 105/2, 113/7, 117/3ඒ 117/4, 117/5, 117/7, 123, 123/1, 127, 155, 84/3, 84/6, 84/7, 138/6 138/9, 150, 190, 192.

ජලාශය පාර.—22/3, 22/15, 22/19ඒ.

කදුරුපොකුන පාර.—22, 22/6, 54/1, 54/2.

කොට්ඨාශ අංක 3

මාතර පාර.—68, 72, 80.

ධම්මදින්න මාවත.—16, 26, 9.

පන්සල්පොකුන පාර.—1, 1/8, 1/12, 1/15, 1/16, 7, 7/1, 7/2, 7/6, 7/7, 7/8, 7/9, 7/11, 9.

ඉදිපොකුනගොඩ පාර.—8, 14/1, 22/1, 22/2, 22/5, 78/4, 96/1, 96/1ඒ, 124.

කොට්ඨාශ අංක 4

සුසාන භූමිය පාර.—7, 13, 2, 4, 6, 6/1, 6/2, 8, 24, 26, 28, 30.

දන්කැටිය පාර.—5/3, 21/5, 21/20, 29, 35/4, 28, 30/12.

ධම්මරතන මාවත.—7.

හම්බන්තොට පාර.—61, 61/18, 61/20, 61/25, 61/27, 71/6, 71/19, 71/28, 71/34, 71/39, 71/44, 79/2, 81, 81/4, 91/12, 105/4, 109, 119, 177, 193, 195, 249, 251, 251/1, 251/3, 255, 263/1, 301.

වීරකැටිය පාර.—18, 22, 26, 30, 32, 36, 68, 94, 166/2, 166/4, 166/10, 166/13, 166/15, 166/23, 15/13, 15/23, 41, 61/8, 69/8, 75, 111/1, 111/4, 131/5.

කොට්ඨාශ අංක 5

හම්බන්තොට පාර.—68, 106/2, 130, 136, 146, 156, 180, 186, 200/4, 200/16, 200/18, 202, 218, 224, 268, 288.

මැදකැටිය පාර.—21, 35/2, 35/3, 35/4, 35/5, 35/6, 35/7, 37, 37/1, 37/2, 39, 41, 69, 73, 95, 32, 42/1, 52, 58/4, 70, 76, 80, 88/1, 96, 104.

මොදර පාර.—27, 26/9.

අශෝක මාවත.—5/1, 18/2, 24.

අලුත් පටුමග.—7, 16, 18, 18/1, 30.

මැදකැටිය පාත්.—15, 17, 27, 27/1, 55/1, 61, 71/6, 75, 16, 22, 24, 36.

දීපංකර පාර.—5, 15, 15බී, 21, 35, 12, 22, 32, 36, 40, 40ඒ, 44, 44/2, 50.

විජය පාර.—7/1, 67, 73/2, 91, 105/2, 109, 117, 117/1, 157, 12, 34/1

12-509—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළකරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනයට ප්‍රථම වැඩ කරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාර ගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් ඒය ඒවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළයුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උචිතා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් ගැට එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ. ය.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

උපලේඛනය

**1973**

| මාසය | | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|---|
| දෙසැම්බර් | ... | 73.12.07 | සිකුරාද | ... | 73.11.30 | සිකුරාද | දහවල් 12.00 |
| | | 73.12.14 | සිකුරාද | ... | 73.12.7 | සිකුරාද | දහවල් 12.00 |
| | | 73.12.21 | සිකුරාද | ... | 73.12.14 | සිකුරාද | දහවල් 12.00 |
| | | 73.12.28 | සිකුරාද | ... | 73.12.21 | සිකුරාද | දහවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 මැයි මස 04 වැනි දින.
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව